
භක්ති ප්‍රබෝධනය
පවුලේ සඟරාව

# භක්ති ප්‍රබෝධනය

2020 ජනවාරි

සියවසක් ඉක්මවූ නොනවතින යුග මෙහෙවර

# අධ්‍යාත්මය හා අධ්‍යාපනය



ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල සඟරාව

ආරම්භය 1899

# භක්ති ප්‍රබෝධනය

2020 ජනවාරි කලාපය

**ප්‍රකාශනය**

නිර්මල මරිය නිකාය

**භාරකරු**

අති ගරු අර්වින් එච්. මොරායස් නි.ම.නි. පියතුමා
නිර්මල මරිය නිකායික කොළඹ ප්‍රාදේශාධිපති
කොළඹ ප්‍රාදේශිකය

**සංස්කාරක**

ගරු එමාඩ් දල්පතාදු නි.ම.නි. පියතුමා

**සහාය සංස්කාරක**

රූපස් ප්‍රැන්සිස්
ටී. සුනිල් ප්‍රනාන්දු
පිලීෂන් අබයකෝන්

**කාර්යාලයීය සහාය**

දිනේෂා රණවක

**මුද්‍රණ සැලසුම හා කවර නිර්මාණය**

සිසිර විජේතුංග ග්‍රැෆික්ස්

**මුද්‍රණය**

කතෝලික මුද්‍රණාලය
කොළඹ 08

## පිටුවෙන් පිටුව.........

**2** කවරයේ කථාව

**3** හෙළිදරව්ව

**4** අධ්‍යාත්මය හරහා අධ්‍යාපනය මල්පල ගැන්වේ
- අශේන් සියඹලාපිටිය

**8** විවාහයේ අභිරහස්මය අධ්‍යාත්මය
- ගරු ඩෙනින්ටන් සුබසිංහ පියතුමා

**11** ආධ්‍යාත්මික ජීවිතයේ පන්නරය කුඩා අවධියේ ආගමික වටපිටාවයි
- නිර්මාල් අශාන් නෝනිස්

**12** අධ්‍යාත්මය හා විද්‍යාත්මක සෞඛ්‍යය
- සවිත මෙන්ඩිස්

**14** නූතන පවුල් ගමන් මග - ඩල්සි මෙන්ඩිස්

**16** අධ්‍යාපනය හා අධ්‍යාත්මය (ප්‍රතිපදාව)
- දීප්ති සිල්වා

**19** ඕං එහෙනං - සූරිය මාමා

**20** ආගමික අධ්‍යාපනය සහ අධ්‍යාපනයේ ධර්මය
- ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා

**22** බිය. - ඔකිත දෙව්මිණ රන්දෙනිය

**24** පුංචි විකුම්. - සූරිය මාමා

**25** සභා ඉගැන්වීම් තුළින් දේවරාජ්‍යය පතළ කරන්නට වෙර දැරූ ශු. ජෝන් ඩාමසින් මුනිතුමා
- ගරු ලක්මාලි ප්‍රනාන්දු පැවිදි සොහොයුරිය ශු.ප.

**26** ආධ්‍යාත්මිකත්වය සහ ස්ත්‍රීත්වය
- කැත්ලීන් ජයවර්ධන

**28** ප්‍රහේලිකා අංක 56
- ගරු ලක්මාලි ප්‍රනාන්දු පැවිදි සොහොයුරිය ශු.ප.

**29** කතෝලික ධර්මය, අ.පො.ස (සා/පෙළ) ආදර්ශ ප්‍රශ්න පත්‍රය - 2020
- ජේ.ඒ.එල්.එම්. ශ්‍රිමතී සිල්වා මෙනවිය

**31** ලක්දිව ක්‍රිස්තු ශාසනය (VI) / අ.පො.ස. (උ.පෙ.) ශිෂ්ටාචාරය සඳහා අත්වැලකි
- එස්. හේමාල් පෙරේරා

**භක්ති ප්‍රබෝධනය**

දායකත්වය එක් වසරකට - රු.500.00
(මුද්දර ගාස්තුව ද ඇතුළත්ව)
දායකත්වය සහ මසකට - රු.250.00
(මුද්දර ගාස්තුව ද ඇතුළත්ව)

සියලුම ලිපි, දායකත්ව මුදල් හා විමසීම් මේ ලිපිනයට යොමු කරන්න.

සංස්කාරක පියතුමා.
භක්ති ප්‍රබෝධනය
265, ඩීන්ස් පාර, මරදාන, කොළඹ 10.
දුරකතන : 011 2698177
ඊමේල් : bprabodanaya@gmail.com


**BHAKTHI PRABODHANAYA**
**Local Subcription Rate.**
Rs. 500.00 per year (Including Postage)
Rs. 250.00 per 6th months (Including Postage)

Letters, subcribtions and inquires shuould be addressed to:

Editor.
"Bhakthi Prabodhanaya"
265, Deans Road, Maradana,
Colombo 10, Sri Lanka.
el.: (94) 011-2698177
Email: bprabodanaya@gmail.com

වසර 1899 සිට අඛණ්ඩව
එළිදක්වන භක්ති ප්‍රබෝධනය
ශ්‍රී ලංකාවේ පළවන
ඉපැරණිම සිංහල සඟරාවයි.
භක්ති ප්‍රබෝධනය
නිර්මල මරිය නිකායේ
කොළඹ ප්‍රාදේශිකයේ
භාරකාරත්වය යටතේ
පළවන ප්‍රකාශනයකි.
(නි.ම.නි.)

Bhakthi Prabodhanaya,
Published continuously
sine 1899, is the oldest
Sinhala magazine in Sri Lanka.
Bhakthi Prabodhanaya,
is owned and published by
the Colombo Province of the
Oblates of Mary Immaculate.
(O.M.I.)




## කවරයේ කථාව

අධ්‍යාපනය ලැබුවත් අධ්‍යාත්මය නැති කෙනකු පූර්ණ මනුෂ්‍යයකු වීම දුෂ්කරය. යහපත අයහපත අතර දෝලනය වන මනුෂ්‍ය ජීවිතයේ ශ්‍රේෂ්ඨත්වය රැඳෙන්නේ ඔහුගේ හෝ ඇයගේ අධ්‍යාත්මය තුළය. එවැනි ආධ්‍යාත්මික ජීවිතයක සුවිශේෂ ලක්ෂණ ගණනාවක් පවතින්නේය. මානව හිතවාදී ඉරියවු හරහා සත්‍යවාදීව, විනිවිද ස්වභාවයකින් යුතුව, දූරදර්ශී වී සන්සුන්ව, උපේක්ෂාවෙන් ජීවිතය දෙස බලමින් ලොකු නිශ්චලතාවකින්, අභියෝග හමුවේ අචලව ජීවිත ගමනේ පියවර තබයි. ස්වභාවධර්මයේද කැලඹෙන අවස්ථා විටින් විට අප අත්දැක ඇත. ගංවතුර, නාය, සුනාමි, නියඟ ඉන් සමහරකි. එහෙත් ස්වභාවධර්මයේ නිශ්චලතාව අපවද සංසුන් කරයි. සුවපත් කරයි. ආධ්‍යාත්මික ජීවිතයක වුවමනාව හදවත තුළ ජනිත කරයි. පුරපසළොස්වක පොහෝ දිනක සඳ පායා ගංගාවකට පතිත වන සඳ රැස් කිරණින් නිසංසල රාත්‍රිය වර්ණවත් වේ. ස්වභාවධර්මයේ චමත්කාරය හා නිශ්චලතාව කෙනකුගේ ගැඹුරු අධ්‍යාත්මයට කවරයේ කථාව සංකේතවත් කරයි.

### අධ්‍යාත්මය යනු ............. ?

ක්‍රිස්තියානි ආගම ආත්මය විශ්වාස කරන ආත්මික චින්තනයකි. ආත්මීය යනු ස්වකීයයි. බුද්ධාගම අනාත්මයි. ආත්මාරක්ෂාව, ආත්මාභිමතය, ආත්ම ගෞරවය, ආත්ම විශ්වාසය කියද්දී ආත්ම යනු තමාගේ තේරුමිනි. අධි යන අධිකාර්ථ උපසර්ගය යෙදූ විට ආත්මය අධ්‍යාත්මය වේ. හින්දි බසින් පවා මින් අදහස් වන්නේ ස්වර්ගීය හෝ අලෞකික සම්පත්තියකි. බුද්ධ ධර්මයෙහි දකින අභිධර්මය ඉංග්‍රීසියෙන් METAPHYSICS ය. ඊටද අධ්‍යාත්ම විද්‍යාව යයි පාරිභාෂික වචනයකි. එහෙත් බොහෝ දෙන අද අධ්‍යාත්ම යන වචනයෙන් සැදෙන ආධ්‍යාත්මික පදය ආත්මික හෝ අභ්‍යන්තර අර්ථය ගනිතැයි සිතති. ආධ්‍යාත්මික ගුණවගාව, ආධ්‍යාත්මික පෙරළිය, ආධ්‍යාත්මික අභිවෘද්ධිය යන යෙදුම්වලින් ඔවුන් තේරුම්ගත් සැටි කෙබඳුදැයි සිතාගත හැකිය.

**පිලීෂන් අබයකෝන්**

# හෙළිදරව්ව

## අධ්‍යාත්මය වැහැරී ගියොත්.....?



සතකුට නැති මනුෂ්‍යයාට පමණක් ඇති එක් ඒකකයකි, අධ්‍යාත්මය. අධ්‍යාත්මය දියුණු කරගත් මනුෂ්‍යයාගේ හැසිරීම කථාවෙන් පමණක් නොව ක්‍රියාවෙන් ද සක්සුදක් සේ පැහැදිලිය. අධ්‍යාත්මයෙන් තොර අධ්‍යාපනය ඉතා භයානකය. ඇතැම් අය අන් අයව රවටන්නේ, නොමනා ලෙස හැසිරෙන්නේ, ඉතා පහත් වින්දනයක් ලබමින් අනිකාව, අපහසුතාවට පත්කරන්නේ, වංචාව, හොරකම, මැරකම, ජඩකම, අමනකම ඇඟ පුරා ගලා ගෙන යන්නේ සැබැවින් ඔවුන් අධ්‍යාත්මයක් ගොඩනගාගෙන නැති නිසාය. ආගමක් අදහන බව පෙන්වා අනුන් ඉදිරියේ රඟපෑවත් සැබෑ අධ්‍යාත්මයක් නැති නිසා අයාලේ යන බවක් පෙන්නුම් කරයි. **''දකින විට පන්සලක්, බෝධියක්, පිළිමයක්, හුනස්නෙන් නැඟිටිමින් වඳිනවා, හදේ නැති භක්තියක් වත පුරා තවරගෙන අඩවන්ව නෙත් බරව බලනවා''** අපේ රඹුකන හාමුදුරුවෝ රචනා කළ මේ සිංදුව මතු කරන්නේ ආගම අදහන්නන්ගේ කුහකකමයි. බැලූ බැල්මට උන්වහන්සේගේ පණිවුඩය බෞද්ධ බැතිමතුන්ට පමණක් ඉලක්ක වුවත් එය හැම ආගමික බැතිමතකුට විවෘත වන පොදු හැඟීමකි. සැබෑ ආධ්‍යාත්මික ජීවිතයක් ගත කරන්නන්ට තම සහෝදර ජනතාවට අසංවේදීව කටයුතු කළ නොහැකිය.

තම දහම් පණිවුඩයේ හරය නිවැරදිව අවබෝධ කර නොගෙන ආගම අදහන බව පෙන්වන්නට යන විට ඔවුහු දහම ප්‍රදර්ශනයකට සීමා කරති. දහම් පණිවුඩය ජීවත් නොවී දහම ඇසීමට පමණක් සීමා කරන්නන්ට ජාකොබ් තුමා මෙසේ පවසයි. **''කැඩපතකින් තමාගේ මුහුණු ඇති සැටියෙන් බලා එහි සැබෑ තත්ත්වය වහා අමතක කරන මිනිසකුට සමාන කරයි'' (ජාකොබ් 1:22-24).**

දහම් පණිවුඩය වනාහි දහමේ ඇති වත් පිළිවෙත්වලට වඩා පුළුල් පරාසයකට විහිදේ. දහම් පණිවුඩය නොසලකා බැති පිළිවෙත්වලට පමණක් කොටුවන ජනතාවකට අනාගතයක් නැත. වගතුවක් නැත. ජාතිය, ආගම, කුලය, පක්ෂය, දේශප්‍රේමී සහ දේශද්‍රෝහී මේ ආදි විවිධ කාරණ මත බෙදෙන සහ බෙදන ජන සමාජයක් විරසක වේ. එක්තැන පල්වීමක් හැර ඉදිරියට යෑමක් නොමැත. ඉහත අහිතකර ප්‍රවණතා ඇති ඕනෑම සමාජයක ජීවත් වන්නන් සැබෑ දහම් පණිවුඩය තුළින් මතුවන අධ්‍යාත්මය යටපත් කර ගැනීමට නානා ප්‍රකාර උප්පරවැට් භාවිත කළත් ඉන් මතුවන අනිසි බේදනීය පලවිපාක දිනෙන් දින ජනතාව වළපල්ලට රැගෙන යයි. එබැවින් මුළු ජන සමාජය පුරා ආධ්‍යාත්මික අර්බුදයක් පැන නැඟී ඇති මෙවන් කාලයක අධ්‍යාත්මය වැහැරී ගිය පුද්ගලයකුට රැකගැනීමට කිසිවක් නැතැයි යන ප්‍රකට කියමන මෙහිදී මතක් කර ගනිමු.

# අධ්‍යාත්මය හරහා අධ්‍යාපනය මල්පල ගැන්වේ.

හිමිදිරි උදයේ අරුණලු අබියස විකසිත වීමට මග බලා සිටින්නාවූ කුසුම් මෙන් පුළුල් සමාජයට ප්‍රවිෂ්ට වීමට බලා සිටින්නාවූ අපගේ ආදර දූ පුතුන් වෙත ආදරයෙන් මෙසේ ලියමි.

ලෞකික සැප සම්පත් හා මුදල මත මිනිස් ජීවිතයේ වටිනාකම් මැන බලන්නාවූ තරඟකාරී වර්තමාන සමාජය තුළ කාලයට බොහෝ උචිත මාතෘකාවක් පිළිබඳව අපට පෙනෙන මානයේ කරුණු සොයා බැලීමට අපි මෙසේ උත්සාහ දරමු.

අධ්‍යාපනය යනු බොහෝ පුළුල් පරාසයකට දිව යන්නාවූ මාතෘකාවක් වුවද, වර්තමානයේ අප බොහෝ දෙනකු මෙය හඳුනාගෙන ඇත්තේ පොතපත දැනුමට පමණක් සීමා වූ, එසේ කටපාඩම් කරගත් විෂය කරුණු උපයෝගී කර ගනිමින් පැය කිහිපයක ප්‍රශ්න පත්‍රයකට මුහුණ දී එයින් ලද ලකුණු මත තම මුළු අනාගත දිවියම තීරණය කරන්නාවූ ක්‍රමෝපායක් ලෙසයි. එහෙත් නිසි අධ්‍යාපනයක් ලැබීම යනු මෙයින් බොහෝ ඔබ්බට ගිය පුළුල් විශ්වීය දැනුම් සම්භාරයක් අත්පත් කර ගැනීමකි. එය අපගේ මනසට වටහා ගත හැකි සරල අයුරින් කතා කළහොත් දැනුම, කුසලතා හා ආකල්ප යන ත්‍රිවිධ අංශයෙන්ම සන්නද්ධ වූ පුද්ගලයකු ලොවට බිහි කිරීමයි. මේ තුළින් සමාජයට ප්‍රායෝගික වටිනාකමක් ඇති පුරවැසියන් බිහි වන අතර, ඔහු තමාට ද, සමස්ත සමාජයටද, යහපතක් කිරීමට පුහුණුවක් ලබයි. එහෙත් මෙය නිසි ලෙස සඵල වීමට නම් පුද්ගලයකුගේ ආධ්‍යාත්මික පැතිකඩද සමබරව ඊට හවුල් විය යුතුවේ. එසේ සමබර නොවීම නිසා සමස්ත සමාජයටම මුහුණ පාන්නට සිදු වී ඇති ගැටලුකාරී තත්ත්වවලට උපහැරණ අමුතුවෙන් සැපයීමට වුවමනා නැතැයි සිතමි. ඒ මන්දයත් මනුෂ්‍ය වටිනාකම් පවා මුදලට, බලයට සීමා වී ඇති මෙවන් පරිසරයක අන් කිසිවකු පිළිබඳව හෝ නොතකා මහා ධාවන තරඟයක නියැලෙන තරඟකරුවන් මෙන් අප ඉදිරියටම දිව යන හෙයිනි.

එසේ නම් පුද්ගලයකුගේ ආධ්‍යාත්මික පැතිකඩ පිළිබඳවද යම්තාක් දුරට අවබෝධ කර ගැනීමට අපි මෙලෙසින් උත්සාහ දරමු. කිතුනු අපගේ ආධ්‍යාත්මික ජීවිතය පිළිබඳ කථා කළහොත් සාපේක්ෂව දරුවන්ගෙන් බොහෝ දෙනෙක් දිව්‍ය පූජා යාගයට, දහම් පාසලට, විවිධ යාච්ඤාවලට, භක්ති අභ්‍යාසවලට හා නොයෙකුත් සමිතිසමාගම් වලට ඉතා උනන්දුවෙන් සහ ආශාවෙන් සහභාගි වෙති. මෙය ඉතාමත් සතුටුදායක තත්ත්වයකි. එහෙත් මෙවන් ලස්සණ ආගමික වටපිටාවකින් හෙබි සුන්දර ළමා කාලය ද දැන් දැන් (ඉරුදින අමතර පන්ති) මාරයාගේ බිහිසුණු ප්‍රහාරයට ගොදුරු වෙමින් පවතියි. තරුණ දූ පුතුන් ද සැලකිය යුතු මට්ටමින් සමිතිසමාගම් ආශ්‍රයෙන් හෝ ආධ්‍යාත්මික වටපිටාවට හවුල්කරුවන් වන අතර අපගේ ආදර මව්වරුද බොහොමයක් තවමත් දහමේ රැකවරණයට නතුවී ජීවත් වීමට උත්සාහ දරති. එහෙත් පියවරු නම් ඇල්මැරුණු ස්වරූපයෙන් ඉතා සුළුතරයක් පමණක් ආධ්‍යාත්මික වැඩ කටයුතුවලට සහභාගි වෙති.

එහෙත් අපි මඳක් සිතා බලමු. අධ්‍යාත්මය යනු දේවවන්දනාවට, වත්පිළිවෙත්වලට හා විවිධ භක්ති අභ්‍යාසවලට පමණක් සීමා වුවක්ද ? ඉහත කී කාරණාවලට නම් අප අඩුවක් නැතිව සහභාගි වන නමුත් ඇත්තෙන්ම අපගේ අධ්‍යාත්මය එය තුළින් කොතෙක් දුරට ගොඩ නගාගෙන තිබේදැයි අප දෙසටම හැරී බලමු. අප තුළ සැබෑ දේව විශ්වාසයක් හෝ ප්‍රබල ආධ්‍යාත්මික ශක්තියක් නිර්මාණය වී තිබේද ? එසේ වී නම් අප මඳක් සිතා බලමු දරුවකු ලෙස අප කතාබහ කරන ආකාරය, හැසිරෙන ආකාරය, පුද්ගල සබඳතා ගොඩනගා ගන්නා ආකාරය, වැඩිහිටියන්, ගුරුවරුන් හා දෙමාපියන් සමඟ කටයුතු කරන ආකාරය, එකිනෙකා පරයා යමින් තරගකාරී අධ්‍යාපනයකට යොමු වී ඇති ආකාරය හා ඒ සියලු කරුණුකාරණා ඉදිරියේ, ආධ්‍යාත්මික වටිනාකම්වලින් හෙබි නිසි අධ්‍යාපනයක් අප ලබා ගන්නේ කෙසේද ?

ඉදින් කරුණුකාරණ මෙලෙස සොයා බැලූ අපට ඉතා පැහැදිලිව තේරුම් ගත හැකි කරුණක් නම් අධ්‍යාත්මය හා අධ්‍යාපනය එකිනෙකින් වෙන් කළ නොහැකි, එකිනෙක අන්‍යෝන්‍ය වශයෙන් පෝෂණය කිරීම තුළින් කතෝලික පසුබිම අනුව නම් දේව කැමැත්තට අනුකූලව ලොවට යහපත් මිනිසුන් දායාද කරන්නාවූ පාර්ශ්ව දෙකක් වන බවයි.

අප ඉහත සාකච්ඡා කළ පරිදි අධ්‍යාත්මය හා අධ්‍යාපනය සමබරව තම ජීවිතයට සම්බන්ධ කර ගැනීම තුළින් යහපත්, සාර්ථක, ඵලදායී දිවි පෙවෙතක් උදා කරගත හැකි ආකාරය පිළිබඳවද අධ්‍යාත්මය හා අධ්‍යාපනික පැතිකඩ නිසි ලෙස පවත්වා ගැනීම මගින් ජීවිතය ජයගත් අය සම්බන්ධව බොහෝ උපහැරණ ඇතත්, ඔබගේ ජීවිතයට වඩාත් සමීප වේ යයි මා හට දැනුණු මේ සත්‍ය කථාව ඔබ ඉදිරියේ දිගහැරුමට තීරණය කළේ ඉතා කැමැත්තෙනි.

(එහෙත් මෙහි එන කාලවකවානු හා නම්ගම් මනඃකල්පිත වේ.)

අචින්ත පවුලේ මද්දුමයා වූ අතර ඔහුට වැඩිමහල් සොහොයුරෙක් හා බාල සොහොයුරෙක් වූහ. කුඩා කල සිටම පවුලේ සියලුදෙනා පවුලේ දියුණුව උදෙසා වෙහෙස මහන්සි වු අතර, ආධ්‍යාත්මික වැඩ කටයුතුවලටද ඉන් වේලාවක් වෙන් විය. අධ්‍යාත්මය යන්න පිළිබඳ හරිහැටි අවබෝධයක් නැතත් හැමදා යාච්ඤා කිරීම හා දිව්‍ය පූජා සඳහා සහභාගී වීම, අතපසු නොකළ අතර, දේවස්ථානයේ විවිධ සමිතිසමාගම්වලටද පවුලේ සියලු දෙන ක්‍රියාකාරීව සහභාගි වූහ.

තම සොහොයුරන් දෙදෙනාම අධ්‍යාපන වැඩ කටයුතුවලට මෙන් බාහිර වැඩකටයුතුවලටද එකසේ දක්ෂතා දැක්වුවද, අචින්ත ක්‍රීඩාවලට හා බාහිර වැඩකටයුතුවලට දක්ෂතා පෙන්වූවත් පොතපත අධ්‍යාපනයේ හපනෙක් නොවීය. ඒ කොතෙක්වීදයත් තම සොහොයුරන් දෙදෙනා පාසල් වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවයේදී අධ්‍යාපන දක්ෂතා සඳහා ත්‍යාග හා සහතික පත් ලබා ගනිද්දී අචින්තට හිමි වුයේ තම පන්තියේද අන්තිම කිහිපදෙනා අතර රැඳීමටයි. එය තවදුරටත් විස්තර කළහොත් ඔහු අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයට මුහුණ දෙන තුරුම කිසිදු දිනක ගණිතය හෝ ඉංග්‍රීසි විෂය සමත් වීමට හැකියාවක් දැක්වුයේ නැත. ඒ සඳහා ඔහු කෙතරම් උත්සාහ කළත් ඉන් පලක් වුයේ ද නැත.

කරුණු එසේ සිදුවෙමින් තිබියදී නොසිතූ වේලාවක ජීවිතයේ මාරාන්තික අත්දැකීමකට මුහුණ පාන්නට ඔහුට සිදු විය. ඒ 2002 සැප්තැම්බර් මස 29 වන දින ශරීරයට දැනුණු දරුණු අපහසුතාවක් නිසා රුධිර සාම්පල (නියැදි) පරීක්ෂා කළවිට වෛද්‍යවරයාගේ අවසන් නිගමනය වුයේ හැකි විගස රෝහල්ගත වන ලෙසයි. රෝහලේදී කරන ලද වැඩිදුර පරීක්ෂණ අනුව නිගමනය වූයේ අචින්ත රුධිරගත පිළිකා (ලෙයුකේමියා) තත්ත්වයකට භාජනය වී ඇති බවයි. මෙය පවුලේ අය අචින්තගෙන් සැඟවීමට උත්සාහ කළත්, පාසැලේ විද්‍යා විෂයය යටතේ මේ රෝගී තත්ත්වය පිළිබඳව මේ වනවිටත් හොඳින් දැන සිටි ඔහු මවගෙත්, පියාගෙත්, සොහොයුරන්ගෙත්, නෑදෑ හිත මිත්‍රාදීන්ගෙත් ශෝකය තවත් වැඩි නොකරනු පිණිස කිසිත් නොදන්නා සේ හැසිරුණේය. මන්ද තම මව, පියා හා නෑදෑ සමූහයාගේ මුහුණුවල දිස් වුයේ මින් සති කිහිපයකට පෙර මිය ගිය තම ලොකු අම්මලා දෙදෙනාගේ අවමංගල්‍ය දින ඔවුන්ගේ මුහුණුවල තිබූ ශෝකාකූල පෙනුමටත් වඩා වැඩි ශෝකාකූල ස්වරූපයකි. මේ අතරතුර මේ තත්ත්වය දැනගත් එවකට මීසම භාර පියතුමන් පැමිණ අචින්තට ආශිර්වාදය දානය කළ අතර මවගෙත්, පියාගෙත් මුහුණු දෙස බලා ප්‍රකාශ කර සිටියේ "විශ්වාසයෙන් ඉන්න" යනුවෙනුයි. එහෙත් එදා අචින්ත ඇතුළු එතැන සිටි කිසිවකුත් නොසිතන්නට ඇති මෙය අචින්තටත් පවුලේ හැමටත් ලැබුණු වෙස්වළාගත් මහා ආශීර්වාදයක් වන බව.

එතැනින් මහරගම අපේක්ෂා රෝහලට (පිළිකා ආයතනයට) ගෙන ගිය අචින්ත බාහිර පරිසරයෙන් මිදී හිරු එළියක් නොලද වාට්ටු

සංකීර්ණය තුළට කොටු විය. නිතර දෙනෙතට ගැටුණේ වේදනාවෙන් කෑ මොර දෙන රෝගීන් හා ක්ෂණයකින් ජීවිතය අතුරුදහන් වු තම අසල්වැසි රෝගීන්ගේ නිසල සිරුරුය. රාත්‍රියට කිහිපවිට තිගැස්සී නින්දෙන් අවදි වූයේ තම ජනේලය පිටුපසින් මිනී කාමරය (මෝචුවරිය) ට වැටී තිබුණු මාවතේ මෘත ශරීර ගෙනයන ට්‍රොලිවල ශබ්දයෙනි. කෙසේ හෝ වෛද්‍ය ප්‍රතිකාර ආරම්භ කළද වෛද්‍යවරුන්ගේ මුවින් නිතර ප්‍රකාශ වුයේ අපට හැකි පමණින් අප වෛද්‍ය ප්‍රතිකාර කර ඇති බවත් ඔබ අදහන ආගමකට දහමකට අනුව කළ හැකි යමක් කරන ලෙසයි.

ඒ වනවිටත් අචින්තගේ පවුලේ අය හා නෑදෑ හිත මිතුරන් දෙවිඳුන් ඉදිරියේ එකම විශ්වාසයෙන් යදින්නට වූහ. ඇත්තෙන්ම වැඩිකල් නොගොස් දේව විශ්වාසය කරණකොටගෙන වෛද්‍ය වාර්තා බිඳ දමමින් දිනෙන් දින අචින්ත සුවය ලබන්නට විය. අචින්ත සහ පවුලේ අය කුඩා කළ සිට යාච්ඤාව, දේව වන්දනා වත්පිළිවෙත්, විවිධ භක්ති අභ්‍යාසවලට සහභාගී වූවත් ඇත්තෙන්ම ඒවා තුළින් දෙවිඳුන් හඳුනාගෙන ආධ්‍යාත්මික දිවි පෙවෙත සවිමත් කර ගැනීමට පටන් ගන්නේ මේ කාල වකවානුව තුළය. **විශේෂයෙන් අචින්ත රෝහල තුළදී දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ තුළින් ක්‍රිස්තුන් වහන්සේව හඳුනාගන්නා අතර යාච්ඤාවට භාවනාවට වැඩි කාලයක් යොදවයි. ඒ කාලය තුළ හිසකෙස් නියපොතු ශරීර ශක්තිය ආදි භෞතික ශරීරයේ බොහෝ දේ විනාශ වී ගියත්, ආධ්‍යාත්මික ජීවිතය නිසිලෙස වර්ධනය වීම ආරම්භ වන්නේ මේ කාලයේදීය. තවද දේව විශ්වාසය පල ගන්වමින් යම්තාක් දුරට සුවය ලබා තුන් මසකට පසු කිතු උපත සැමරීමට දෙදිනකට නිවස වෙත යෑමට වෛද්‍යවරුන්ගෙන් අවසර ලබයි. ඔහු අදටත් ප්‍රකාශ කරන ලෙස ඒ නත්තල නම් මේ දක්වා ඔහුගේ ජීවිතයේ ඔවුන් පැවැත්වූ හොඳම නත්තලයි.**

එතැන් සිට වසරක් පුරා රෝහලේ අභ්‍යන්තර ප්‍රතිකාර ලබන අතර තම ශරීරය තුළ ඇති අහිතකර සෛල මර්දනය වූවත් ආධ්‍යාත්මික ජීවිතය නම් දැඩි ලෙස වර්ධනය විය. මේ රෝගී තත්ත්වය නිසා 2003 වසරේ අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටීමට නොහැකි වුවද මනා ශාරීරික හා මානසික ශක්තියක් නොතිබුණත් දැඩි ශක්තිමත් ආධ්‍යාත්මික පසුබිමක සිට ඉදහිට දින කිහිපයක් පාසැල් ගොස් වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යයේ 2004 වසරේ අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිට බෙහෙවින් ඉහළ මට්ටමක ප්‍රතිඵල ලබා ගැනීමට සමත් විය.

එලෙස අන් විෂය ධාරා හැදෑරීමට ප්‍රතිඵල තිබුණද දෙවිඳුන්ට දැක්වූ ආදරය හා ගෞරවය නිසා කතෝලික ධර්මය හැදෑරීමේ අරමුණින් කලා විෂය ධාරාවට ඇතුළු වී 2007 වර්ෂයේදී ඉහළ සාමර්ථ්‍යයක් ලබා ගෙන උසස් පෙළ විභාගයද හොඳින් සමත් වූ අතර ඒ වනවිටත් දහම් ගුරුවරයකු ලෙස දෙවිඳුන් අබියස සේවය කරමින් දහම් ගුරුවරයකු වීමට අවශ්‍ය සුදුසුකම් සපුරාලන ධර්මාචාර්ය විභාගයෙන්ද සමත්වී ඥාති පියතුමකුගේ මග පෙන්වීම අනුව දේව ධර්මය හැදෑරීම ආරම්භ කරයි. ඒ වනවිටත් පාසැල් කිහිපයකින් ගුරුවරයකු ලෙස සේවය කිරීමට ආරාධනා ලැබුණත් තමන් ඉගෙනගත් පාසැලේ සේවය සඳහා ඇතුළු වන ඔහු මවගෙත් පියාගෙත් පවුලේ අයගෙත් ශක්තිය හා ආශීර්වාදය මධ්‍යයේ ස්වෝත්සාහයෙන් නිවසක්ද ඉදි කරන ලද අතර එහි බොහෝ වැඩකටයුතු සිදු වන්නේ පවුලේ අයගේ හා තමන්ගේ දැතිනි.

එදා මරණය අබියස පොර බැදූ ඔහු අද වනවිට දක්ෂ ගුරුවරයෙක්, දහම් ගුරුවරයෙක්, දරු දෙදෙනකුගේ පියෙක්ද, යහපත් ගුරු මෑණි කෙනකුගේ ස්වාමිපුරුෂයෙක්ද, දේව ධර්මාචාර්යවරයෙක් ද ලෙස ශු. සභාව තුළ විශාල සේවාවක් ඉටු කරයි. එලෙස ඔහුගේ සොහොයුරෝ හා දෙමාපියෝ ආධ්‍යාත්මික වටපිටාවක් තුළ ඉතාමත් යහපත් දිවි පෙවෙතක් ගත කරති.

එහෙත් මා නැවතත් සිහි කරන්නේ නම් ඔහු පාසලේ ජීවිතයේ කෙදිනකදී හෝ පන්තියේ පළමුවැන්නාවත්, දක්ෂ ශිෂ්‍යයකුවත් නොවීය. ඉතින්

දිවි ගමනේ මෙතරම් දුරක් ගමන් කිරීමට ඔහුට හැකි වුයේ කෙසේද ? එය නම් අචින්ත අධ්‍යාත්මය හා අධ්‍යාපනය යන කාරණා නිසි ලෙස අවබෝධ කර ගනිමින් ඒවා නියම ආකාරයෙන් තම ජීවිතයට සම්බන්ධ කරගත් නිසාය. එමගින් ඔහු පමණක් නොව ඔහුගේ පවුලේ සියලු දෙනාගේ ජීවිතද යහපත් විය. එපමණක් නොව ලොව බොහෝ දෙනකුට ද එහි ඵලප්‍රයෝජන අත් විය. ඔහුගේ ජීවිතය බොහෝ අයට ආශීර්වාදයක් විය.

ගෙවී ගිය අතීතය හා වත්මන් සමාජය දෙස එබී බැලුවහොත් අපට බොහෝවිට අසන්නට දකින්නට ලැබෙන කාරණයක් වන්නේ; "ඉස්සර වගේ නෙවෙයි දැන් මිනිස්සු උගත්, ලෝකයත් දැන් දියුණුයි" වැනි අදහස්ය. එහෙත් දියුණුව උගත්කම යනු ජීවිතයක සියලු කාරණා මුදල මත තීරණය කිරීමද ? බලයට සීමා වීමද ? නිදහසේ ආහාර වේලක් හෝ භුක්තිවිඳීමට හෝ ප්‍රස්තාවයක් නොමැති වීමද? පරිසරය විනාශ කර දමා තම සිතැගි නිර්මාණය කර ගැනීමද? ආහාරයට ගන්නා ආහාරපානාදියෙන් පවා වසවිස සම්භාරයක් ශරීරගත කර ගැනීමද ?

ඇත්තෙන්ම මේ දියුණු තාක්ෂණය හා ඒ ඔස්සේ වහනය කෙරෙන දැනුම් සම්භාරය පුද්ගල ජීවිතය යහපත් ලෙස ගොඩනගා ගැනීමට මහත් රුකුලක් බවට පත් වී හමාරය. විශේෂයෙන් වත්මන් දරු පරපුරට මෙය මහත් ආශිර්වාදයකි. සිදු කළ යුත්තේ ආකල්පමය වෙනසක් ඇතිකර ගැනීම පමණි.

එනම් අප යහපත සහ අයහපත හරිහැටි තෝරා බේරා ගැනීම සඳහා අපගේ මනස නියමාකාරයෙන් පුරුදුපුහුණු කිරීමයි. උදාහරණයක් ලෙස අන්තර්ජාලය තුළින් අපට බොහෝ යහපත් දේ හා බොහෝ අයහපත් දේ ගලා එයි. එය ඕනෑම පුද්ගලයකුට තම නිදහස් කැමැත්ත අනුව පරිශීලනය කළහැකි නමුදු ධාර්මික අධ්‍යාත්මයක් තුළ යහපත අයහපත නිවැරදිව තෝරා බේරා ගැනීමට අප සමත් විය යුතුය. උගත් බුද්ධිමත් පුද්ගලයා එහි ඇති යහපත තුළින් තම දිවියට විශාල ඵලප්‍රයෝජනයක් අත්කර ගනියි. එමගින් ලෝකයාටද ඔහු / ඇය මහත් සේවාවක් ඉටු කරනු ඇත.

විශේෂයෙන් ඉතිහාසය තුළ මිෂනාරි අධ්‍යාපන ක්‍රමය හරහා ස්ථාපිත කිරීමට උත්සාහ කළේද මේ ක්‍රමයයි. එනම් ආධ්‍යාත්මික වටපිටාවක් තුළ යහපත් අධ්‍යාපනයක් ලබා දීමයි. වර්තමානයේ වුවද ඔවුන් ස්ථාපිත කළ කතෝලික පෞද්ගලික පාසැල් තුළ බාහිර සමාජයෙන් පැමිණෙන බාධක අභියෝග හමුවේ ඉතා අපහසුවෙන් වුවද එවන් අධ්‍යාපනයක් ක්‍රියාත්මක කිරීමට උත්සාහ දරනු ලබයි. ප්‍රීතියට කරුණක් නම් වර්තමානයේ කතෝලික පරිසරය තුළ වුවද, විශේෂයෙන් දරුදැරියන් දෙමාපියන් හා වැඩිහිටියන්ගේ ආධ්‍යාත්මික පැතිකඩ හා අධ්‍යාපනික පැතිකඩ හරවත් ආකාරයෙන් ජීවිතයට සම්බන්ධ කරගනු වස් ඒ ඒ පරිසරයට උචිත ලෙස පුද්ගල චරිතයන් ගොඩ නැගීම සඳහා විවිධ ආගමික වැඩසටහන් සමිතිසමාගම් වැඩමුළු ආදී රාශියක් දැ තුළින් උත්සාහ කරනු ලැබේ. මේ ප්‍රයත්නය සර්වප්‍රකාරයෙන් සාර්ථක කර ගැනීමට නම් අප එකිනෙකා පෞද්ගලිකව තම තමාගේ ජීවිත තුළට එබී බලමින් සාංඝිකව ලෝකයාගේ ගැලවීම උදෙසා කටයුතු කිරීමක් සිදු කළ යුතුව ඇත.

ඉතින් දුවේ, පුතේ, අනාගත ලෝකය ඔබට බාරයි. සිතන්නට යමක් පුද කරමි, දෙව් වදනින්, **"මිනිසෙකුගේ ගමන් මග සමිඳාණෝ මෙහෙයවන සේක. මිනිසාගේ හෘදය සාක්ෂිය සමිඳාණන් දැල්වූ පහනකි. එයින් ඔහුගේ මුළු අභ්‍යන්තරය විනිවිද පෙනෙයි. වැරදි මග හරිමග කර ගැනීමට නම් ඇතැම් විට දුක්බර අත්දැකීම් අවශ්‍ය වේ" (හිතෝපදේශ 20:24,27,30).**


**අශේන් සියඹලාපිටිය**
**කඳාන ද මැසනොද් විදුහල් ආචාර්ය**

# විවාහයේ අභිරහස්මය අධ්‍යාත්මය

අද කවුරුත් විවාහය ගැන සිතන්නේ එය සමාජ සම්මුතියේ කොටසක් ලෙස ය. කලවයස පිරුණු කළ විවාහ වියට ඇතුළු නොවුණහොත් ඔහු / ඇය පෙලවහක් කර නොගන්නේ මන්දැ යි යන සමාජ ප්‍රශ්නයට මුහුණ දීමට කෙනකුට සිදුවෙයි. එය එසේ වුවත් නව ලිබරල්වාදී මත වේගයෙන් ශීඝ්‍රයෙන් වැළඳගනිමින් පවතින වත්මන් සමාජය තුළ විවාහයට සාම්ප්‍රදායික සමාජය තුළ ලැබුණු වැදගත්කම අඩුවෙමින් පවතින බව කිව යුතුය. විවාහය සමාජ සම්ප්‍රදායකටත් වඩා කෙනකුගේ අති පෞද්ගලික තීරණයක් බවත්, කැමති නම් කසාද බඳින්නටත්, එසේ නොකර සිටීමටත්, දික්කසාද කිරීමට වුවත් පමණක් නොව විකල්ප විවාහ ගැන සිතීමටත් මේ චින්තනයෙන් ඉඩකඩ ලැබෙයි. එබැවින් විවාහය යනු කුමක්දැයි විවාහයේ නිර්මාතෘවරයාණන් වූ දෙවියන් වහන්සේගේ අනාවරණය ඇසුරින් සොයා බැලීම මේ ලිපියේ අරමුණයි. මේ හැදෑරීම සඳහා අප සතු වැදගත්ම මූලාශ්‍රය ශු. බයිබලයේ උප්පත්ති පොතයි. විවාහය අරබයා පැන නැගුණු මතභේදයක් නිරාකරණය කර ගැනීමට පරිසිවරුන් ක්‍රිස්තුන් වහන්සේ වෙත ආ අවස්ථාවකදී ඊට පිළිතුරු දීමට උන්වහන්සේ ද මූලාශ්‍රය ලෙස යොදා ගන්නේ උත්පත්ති පොතයි **(මතෙව් 19:8, මාක් 10:6-9).**

### – "අදාම්" තුළ සැඟවී සිටි "ඒව" –

දෙවියන් වහන්සේට අනුව විවාහය සමාජ චාරිත්‍රයක්වත්, ආගමික වත්පිළිවෙතක්වත්, පෞද්ගලික තීරණයක්වත්, නොව උන්වහන්සේ මැවූ මිනිස් ජීවිතයේ ම ස්වභාවය බව පෙනේ. මනුෂ්‍යයා මැවීමට යෑමේදී උන්වහන්සේ මවන්නට සිතන්නේ කවරාකාර කෙනකුදැයි අප දැනගන්නේ උත්පත්ති කතුවරයා භාවිත කරන "අදාම්" නැමති හෙබ්‍රෙව් වචනය මඟිනි. හෙබ්‍රෙව් භාෂාවෙන් අදාම් (සිංහලෙන් ආදම්) කියා කියන්නේ ස්ත්‍රිය සහ පුරුෂයා යන දෙදෙනාටම ය. අප මනස හුරුවී තිබෙන්නේ පිරිමියාට පමණක් ආදම් කියා කියන්නට ය. මේ වචනයේ අර්ථයට අනුව ගැහැණිය ද ආදම් ය.



මින් අදහස් වන්නේ දෙවියන් වහන්සේට අනුව පළමුවෙන් පිරිමියා, දෙවෙනුව ගැහැණිය කියා දෙයක් නොමැති බව ය. මේ අනුව මිනිසා යනු හුදෙක් පිරිමියා නොවේ. පිරිමියා සහ ගැහැණිය යන දෙදෙනාමය. මෙම කාරණය මිනිසා මැවීම සම්බන්ධයෙන් වන පළමු කතාවෙන් ඉතාමත් පැහැදිලි වෙයි. එනම්;

**"දෙවියන් වහන්සේ තම ස්වරූපයට අනුව 'මිනිසා' (අදාම්) මැවූ සේක දෙවියන් වහන්සේගේම ස්වරූපය අනුව 'ඔවුන්' මවා වදාළ සේක පුරුෂයාද ස්ත්‍රියද වශයෙන් ඔවුන් මැවූ සේක" (උත්පත්ති 1 : 27)** යනුයි.

**“එබැවින් අපගේ සමානකමට මනුෂ්‍යයා මවමු” (උත්පත්ති 1 : 26)** කියා කියන විට දෙවියන් වහන්සේ පවසන්නේ "අපගේ සමානකමට පිරිමියා (Man) මවමු” කියා නොව අපගේ ත්‍රිත්වීය (සාංඝික) දේව ස්වභාවයට අනුව මනුෂ්‍යයා (The Human One) මවමු’ කියා බව දැන් ඔබට පැහැදිලිය. ‘මනුෂ්‍යයා’ යන්න ‘The Human One’ කියා පරිවර්තනය විය යුතුය. එහෙත් එය පිරිමියා ‘Man’ ලෙස ඉංග්‍රීසියට වර නැගුණේය. ‘අදාම්’ නැමති මුල් හෙබ්‍රෙව් වචනය ‘Man’ කියා ඉංග්‍රීසියට පරිවර්තනය වීමෙන් සිදුවූ අර්ථ විනාශය වඩාත් අහිතකර ලෙස බලපෑවේ ශුද්ධවූ බයිබලයේ මිනිසා මැවීම පිළිබඳ දෙවන කතාව අර්ථකථනය කිරීමට යන විටය.

## මිනිසා මැවීම පිළිබඳ දෙවන කතාව ( උත්පත්ති 2 : 18,21 -23 )

‘දෙවියන් වහන්සේ මුලින් ම මැව්වේ පිරිමියාය. පසුව උන්වහන්සේ ගැහැණිය මැව්වේ ය. ඒ පිරිමියාගේ පාළුව මැකීමටය’ වැනි අදහසක් සමාජගත වී තිබෙන්නේ මේ අර්ථ විකෘතිය නිසාය. උත්පත්ති කතුවරයා මේ සටහනේ ද මිනිසා සඳහා ‘අදාම්’ යන හේබ්‍රෙව් වචනය භාවිත කරන්නේ අප ඉහත සාකච්ඡා කළ පුළුල් අර්ථයෙනි. ඒ අනුව පාඨයේ සඳහන් වන්නේ ‘දෙවිසමිඳාණන් වහන්සේ පිරිමියා නොව ‘මිනිසා’ බර නින්දකට පත් කළ සේක’ කියා ය. තව ද ‘බර නින්ද’ යනුවෙන් මෙහි පරිවර්තනය වී ඇත්තේ ‘තර්දේමා’ නැමති හේබ්‍රෙව් වචනයයි. එහි තේරුම බර නින්ද නොව ‘ගැඹුරු සමාධිය’ (උත්පත්ති 15:12 බලන්න) ය. ඒ අනුව පාඨයේ හරය තවත් ගැඹුරු වෙයි. එනම් දෙවියන් වහන්සේ ස්ත්‍රිය මැවීම සිදු කරන්නේ ‘මිනිසා’ සමඟ ගැඹුරු සමාධියකට ඇතුළු වී ඔහුගේ ම අභ්‍යන්තරයෙන් ඇයව එළියට ගැනීමෙනි. එහෙත් මේ පාඨය කියවීමට අප පුරුදු වී සිටින්නේ දෙවියන් වහන්සේ පිරිමියා ශල්‍යකර්මයක දී මෙන් සිහිය නැති කර ඔහුගේ ඉල ඇටයක් ගෙන ස්ත්‍රිය මැවීමට ක්‍රියා කළ ලෙසයි. ඊට හේතුව උත්පත්ති පොතේ මුල් පිටපතේ ඇති ‘අදාම්’ යන හේබ්‍රෙව් වචනයේ අර්ථයට විශේෂ අවධානයක් නොදීමය.

මෙසේ ‘මිනිසා’ පිළිබඳ දෙවියන් වහන්සේගේ අනාවරණය ගැඹුරින් කියවා ගැනීමට අප අපොහොසත් වීමෙන් විවාහය පිළිබඳ දෙවියන් වහන්සේගේ හෙළිදරව්ව යටපත් වුණේයැ යි කිව හැකිය.

## - විවාහය -

දෙවියන් වහන්සේට අනුව විවාහය බාහිර උත්සව කටයුත්තක් නොව මිනිසාගේ නෛසර්ගික මනුෂ්‍ය ස්වභාවය සැමරීමකි. **මිනිසාට අනන්‍ය ස්වභාවය සෑදී තිබෙන්නේ ස්ත්‍රී සහ පුරුෂ යන දෙදෙනාගෙන්ම ය. ඔහු හෝ ඇය එකිනෙකාගෙන් වෙන් කළහොත්, ආරම්භයේ දී දෙවියන් වහන්සේගේ සිතට නැගුණු ‘මිනිසා’ බිහි නොවේ.** ස්ත්‍රිය සහ පුරුෂයා යන දෙදෙනාගෙන් එක් කෙනකු හෝ නොමැතිව මනුෂ්‍යයා ගැන සිතන්නට දෙවියන් වහන්සේට නොහැකිය. ඊට හේතුව දෙවියන් වහන්සේගේ දේව ස්වභාවය විය හැකිය. උන්වහන්සේ තුන්වහන්සේලා මෙන් වුව ද එකම දෙවියන් වහන්සේය. දේව ස්වභාවය තුළ නිරන්තරයෙන් ම ඇත්තේ සාමූහික සහජීවනයකි. දෙවියන් වහන්සේ මනුෂ්‍ය ස්වභාවය මවන්නේ උන්වහන්සේගේ ම දේව සමානකමට බැවින් මනුෂ්‍ය ජීවිතය මේ දේව ජීවිතයට සමානකම් පෙන්වීම ස්වාභාවිකය.

ආරම්භයේදී ස්ත්‍රී පුරුෂ වශයෙන් මනුෂ්‍යයා තුළ තිබුණේ ගැඹුරු ඒකත්වයකි. ඔවුන් දෙදෙනකු වුවද එක්කෙනකු මෙන් කටයුතු කිරීමටත් දෙදෙනාම ‘අදාම්’ නැමැති පොදු නමින් හැඳින්වීමටත් හැකිවූයේ එබැවිනි. මේ අනුව ලෝකාරම්භයේදී මිනිස් දිවිය සහ විවාහ දිවිය යනු දෙකක් නොව එකම කාසියේ දෙපැත්ත මෙන් වූ බව කිව යුතුය.

එහෙත් මිනිසා පාපයට වැටීමත් සමඟ මේ තත්ත්වය වෙනස් වෙයි. **ස්ත්‍රී පුරුෂ වශයෙන් මනුෂ්‍යයා තුළ ආරම්භයේ පැවති ඇතුළත ඒකත්වය මිනිසාගේ වැටීමත් සමඟ විරසක වන**

**ආකාරය උත්පත්ති කතාවේ සටහන් වී තිබේ (උත්පත්ති 3:12 - 14).** පාපය නිසා මිනිසා තුළ ඇතිවන මේ අභ්‍යන්තර දෙදරුම කරණකොට ගෙන මුලින් මනුෂ්‍යයාට එකම අනන්‍යතාවක් සම්පාදනය කළ ස්ත්‍රිය සහ පුරුෂයා, දැන් මිනිසාව බෙදා වෙන්කරන තීරක බවට පත්වෙයි. **දෙදෙනාම හැඳින්වීමට යෙදූ "අදාම්" යන පොදු නම වෙනුවට ගැහැණිය ආමන්ත්‍රණය කිරීමට "ඒව" නම් අලුත් නමක් යෝජනා වෙයි (උත්පත්ති 3:20).** මිනිසාගේ වැටීමෙන් පසු ඇරඹෙන මේ ස්ත්‍රී - පුරුෂ ගැටුම කාලයේ ඇවෑමත් සමඟ තව උග්‍ර වී ඇති බව කිව හැකිය. ආදම් - ඒව, පිරිමියා - ගැහැණිය, ස්වාමිපුරුෂයා - භාර්යාව ආදී වශයෙන් ක්‍රම ක්‍රමයෙන් විස්තාරණය වූ මේ බෙදනීය බෙදීම මුළු මිනිස් සමාජයම ගැහැණු පිරිමි වශයෙන් කඳවුරු දෙකකට කඩා වෙන් කරමින් කෘත්‍රිම ලෝකයක් නිර්මාණය කළේය.

අද අප විවාහය දෙස බලන්නේ දෙවියන් වහන්සේ අපට මවා දුන් ඒ සොඳුරු ලෝකයේ සිට නොව පසුව අප විසින් නිර්මාණය කරන ලද මේ කෘත්‍රිම පව්කාර ලෝකයේ සිටය. එබැවින් විවාහය මිනිස් ජීවිතයේ අති ස්වාභාවිකම ප්‍රකාශනය වෙනවා වෙනුවට එය උත්සාහයෙන් සහ දැඩි පරිශ්‍රමයෙන් පවත්වාගත යුතු සමාජ සංස්ථාවක් බවට පත් වී තිබේ.

## - විවාහයේ අභියෝගය -

විවාහ දිවිය සම්බන්ධයෙන් අද සමාජය තුළ ඇතිවී ඇති ව්‍යාකූලත්වයට හේතුව ආරම්භයේදී දෙවියන් වහන්සේ මැවූ මිනිසා පසුව පරිහානියට යෑමත් සමඟ ක්‍රමක්‍රමයෙන් සිදුවූ සිය ඇතුළත ඒකත්වයෙන් ඈත්වීම බව අපි දැන් දනිමු. මේ පරිහානිය කෙතරම් දරුණුදැයි දිනෙන් දින අභියෝගාත්මක එකක් බවට පත්වන වෛවාහික පවුල් ජීවිතය දෙස බැලූ විට අපට පෙනෙයි. ගණනින් ඉහළ යන වෙන්වීම් සහ දික්කසාදවීම් ඊට එක නිදසුනකි. ඊටත් වඩා භයානක කාරණයක් වන්නේ ස්ත්‍රී - පුරුෂ විවාහයට යෝජනා වෙමින් පවතින විකල්ප විවාහයයි. දැනටමත් ඇතැම් දියුණු බටහිර රටවල නීතිගත වී ඇති සමලිංගික සේවනයට "සමලිංගික විවාහ" යන නම භාවිත වීම ද දක්නට ලැබේ. මේ සියලු කාරණාවලට හේතුව ස්ත්‍රී - පුරුෂ වශයෙන් මනුෂ්‍යයා නිර්මාණය කළ දෙවියන් වහන්සේ මිනිස් ජීවිතය පිළිබඳ මැවූ මුල්ම සිහිනය පිළිබඳ දේව අනාවරණය වරද්දා ගැනීමයි. අපේ පවුල් ජීවිතයේ එදිනෙදා ඇතිවන ප්‍රශ්න සහ ගැටලු, අනවබෝධය සහ පාපය නිසා උද්ගත වන අවාසනාවන්ත සිද්ධි නිවැරදිව තේරුම් ගැනීමටත් ඒවා ඉවසීමෙන් නිරාකරණය කර ගැනීමටත් දෙවියන් වහන්සේ අපට අනාවරණය කර ඇති පරිදි මිනිස් ජීවිතය සහ එහි අභිරහස ගැඹුරින් ග්‍රහණය කර ගැනීම අත්‍යවශ්‍ය වේ. එබැවින් වත්මන් විවාහය මුහුණ පා ඇති සංකීර්ණ අභියෝග ජයගත හැකි වන්නේ මිනිසාගේ වැටීමට පෙර පැවැති නිර්මල ඒකත්වයට යළි පියමැනීමෙන් පමණි. එය කළ හැක්කේ ස්ත්‍රී - පුරුෂ වශයෙන් වන මිනිස් ජීවිතයේ ගැඹුරු ඒකත්වය තේරුම් ගනිමින් ස්ත්‍රී - පුරුෂයන් ලෙස එකට සිතන්නට පුරුදු වීමෙනි. ඒ සඳහා මිනිසාගේ නොදැනුවත්කම නිසා සිය හිසේ පටවාගෙන ඇති කල්පන සහ විකල්ප මතවාද අතහැරීමට ඔවුන්ට සිදුවේ. මිනිසා නිර්මාණය කරගෙන ඇති විෂම ආර්ථික රටාව සහ එමඟින් බිහිවී ඇති අධි පරිභෝජනවාදයත් අසම්පූර්ණ විද්‍යා සහ ආධ්‍යාත්මිකත්වයෙන් තොර අධ්‍යාපන ක්‍රමයක් නිසා වෙන කවරදාටත් වඩා අද "අදාම්" තනිවී සිටී. ඒ තනිකම පුරාතනයේ අදාම්ට දැනුණු පාළු තනිකමම විය යුතුය. හැම මිනිසකුම සොයන මිනිසා තුළම නිදන්ගත සිය පූර්ණත්වය පිරිමියා සහ ගැහැණිය යන **දෙදෙනා එක්ව එක්සිත්ව සිය මැවුම්කරුවාණන් තුළ සොයන තුරු මේ දුක්බර දිවියේ අර්ථය අපට හමුවේ යැයි සිතීම උගහටය.**

**ගරු ඩෙනින්ටන් සුබසිංහ පියතුමා**

# ආධ්‍යාත්මික ජීවිතයේ පන්නරය කුඩා අවධියේ ආගමික වටපිටාවයි

“ගෙන යනු මැනවි මා වටකර ඇති අඳුර මැදින්, ආලෝකයාණනි'' යන වදන් මා හද තුළ නිරන්තරයෙන් දෝංකාර දෙයි. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ තුළ කුඩා අවධියේ සිට විශ්වාසය තබමින් සහභාගි වූ ඉරුදින දිව්‍ය පූජා යාගය, ඉන්පසු දහම් පාසල, ඉරුදින මාගේ අත්දැකීම විය. එයින් තොර වූ ඉරිදා දවසක් ඇත්තේම නැති තරම්ය. දේවස්ථානය කේන්ද්‍රීය කරගත් කිතුනු ග්‍රාමීය සංස්කෘතිය තුළ විවිධාකාර වූ ශුද්ධ වූ කර්තව්‍ය, සමාජීය ක්‍රියාකාරකම් අපගේ ජීවිතයේ කොටසක් වී හමාරය. එහෙත් කිතුනු ග්‍රාමීය සංස්කෘතිය තුළින් ඔබටත් මටත් උරුම වී ඇති මේ ජීවිත පිළිවෙත ආශිර්වාදාත්මක ජීවිත පිළිවෙතක් බව සිහි බුද්ධියෙන් සිතා එමගින් අත්වන්නා වූ ස්වර්ගීය තෘප්තිය අයිති කරගනිමින් ජීවත් වන ජනතාවක් වන්නෙමුද අපි?

කිතුනු ග්‍රාමීය සංස්කෘතිය තුළ වර්ධනය වූ මාගේ ජීවිතයට මාගේ පවුලෙන් උරුම වූ ධීවර ජීවන රටාව විශේෂ රසයක් එක් කළා කීවොත් මා නිවැරදිය. නිරන්තරයෙන් සමිඳාණන් තුළ රැඳෙමින් සමිඳාණන් මත යැපෙන පවුලක අත්දැකීමක් මට කුඩා කල සිට උරුම විය. ආධ්‍යාත්මික ජීවිතයේ අත්තිවාරම ශක්තිමත් කිරීමට මාගේ පවුල තුළ වූ සමිඳාණන් කෙරෙහි වූ විශ්වාසයේ අත්දැකීම මට මහත් රුකුලක් විය. ඉන් නොනැවතුණු දේවස්ථානය කේන්ද්‍ර කරගත් ජීවිත රටාව තව තවත් විශ්වාසයේ අත්දැකීම් ජීවිතයට එක්කරන්නට විය. එවන් වූ ජන සමාජයක් තුළ ජීවත් වීම සැබැවින් මා ලද භාග්‍යයකි. සැබවින්ම කිවහොත් ආගමික ක්‍රියාකාරකම් කියා වර්ග කිරීමට දෙයක් නොමැති තරම්ය. මන්දයත් ඒ සියල්ල ජීවිතයේම කොටසක් බඳුය.

සියල්ල එසේ සිදු වූවද මා වටහා ගත යුතුව තිබූ සරල එනමුත් ගැඹුරු සත්‍යතාවක් තිබුණි. තම පවුල, දේවස්ථානය, සමිතිසමාගම් ඇදහිල්ලේ අත්දැකීම් සමුදායක් ලබා දුන්න ද තමන්ගේ පෞද්ගලික ආධ්‍යාත්මික ජීවිතය ඉහත කී කිසිවක් මත රඳා නොපවතී. මන්දයත් බොහෝ දෙනකු වත්මන් ජන සමාජීය ඒකාකාරී ජීවන රටාව තුළ ජීවත් වන්නේ කරන ක්‍රියාවේ නිසි තේරුම නොදැනය. නූතන, කාර්ය බහුල ජීවිතය තුළ කිතුනුවාද තම ආධ්‍යාත්මික ක්‍රියාකාරකම් හුදෙක් පුරුද්දට හෝ ජීවන රටාවේ කොටසක් කියා හෝ සලකා නිසි අවබෝධයකින් තොරව ක්‍රියාවේ යෙදීමට පුළුවන.

අද මා වෙසෙන නුහුරු නුපුරුදු දේශය තුළ මට එදා නිතර ඇසුණ දෙව්මැඳුරේ සීනුව ඇසෙන්නේ නැත. යාච්ඤාවේ යෙදෙන කිතුනුවන් අඩුවක් දැකිය හැකියි. සමිතිසමාගම් හා සම්බන්ධවීමට අවස්ථාවක් නැත. කොටින්ම කියතොත් ජන සමාජය තුළ ආගමික වටපිටාවක් දක්නට ඇත්තේම නැත. ශ්‍රී ලංකාවේ කිතුනු ග්‍රාමීය සංස්කෘතික ජීවිත රටාව සැබැවින් භාග්‍යයක් සේ මා සලකන්නේ ඒ නිසාය. **කුඩා කල සිටම පවුල, දේවස්ථානය සහ කිතුනු සමිතිසමාගම් හරහා ජීවිතයට අත්කරදුන් ආධ්‍යාත්මික වටිනාකම් පෙරදැරිකරගෙන ගොඩනගාගත් ආධ්‍යාත්මික ජීවිතය, අද වනවිට සමිඳාණන් මත රැඳෙමින් දේව වරප්‍රසාදය තුළින් ඉදිරියට ගමන් කරන බව පැහැදිලි කරුණකි.**

වැටෙන්නට, තනිවෙන්නට, දහසකුත් දේ තිබුණ ද ඒ සියල්ල ජයගන්නට අවශ්‍ය එකම දේ සමිඳාණන් කෙරෙහි වූ අචල විශ්වාසය බව ඔබටත් මටත් පසක් වූ දින අපි සැබවින්ම භාග්‍යවන්තයෝ වෙමු. මේ අත්දැකීම ක්‍රිස්තු ජීවිත අධ්‍යාත්මයේ කොටසක් නොවන්නේ ද?

**“වහල් බවේ අධිපතිකම් රජයන ලොවක් මැදින්,**
**නිවහල් නිදහස් පොරොන්දු දේශෙට නික්ම යමින්,**
**හද පණ ගැහෙනා තුරු නිම නොවෙනා**
**අරගල පරදන අරගලයක් වී,**
**සමිඳුන් අතගත් ගමනක් යන්නෙමු**
**සමිඳුන් අත ගත් ගමනක්.”**

**නිර්මාල් අශාන් නෝනිස්**
**නැ. යුරෝපයේ ලැට්වියාවේ සිට ලියයි.**

# අධ්‍යාත්මය හා විද්‍යාත්මක සෞඛ්‍යය

චිරාත් කාලයක සිට ජීව විද්‍යාත්මකව මානව පරිණාමය මනුෂ්‍ය චින්තන හරහා විස්තර කර ඇත. ප්‍රත්‍යක්ෂ ධර්ම හා සාක්ෂි අනුසාරයෙන් සනාථ කළ හැකි කරුණු විද්‍යාත්මකව පැහැදිලි කිරීමේ හැකියාව තිබේ.

නව භෞතික විද්‍යාවට නව ආලෝකයක් හා පැහැදිලි කිරීම් දායාද කළ සර් අයිසැක් නිව්ටන් නිසා බටහිර සමාජය ආගමික ගැඹුරු පසක ලා ස්වාභාවික සංසිද්ධි විස්තර කිරීම සඳහා ප්‍රමාණාත්මකව කටයුතු කිරීමට පෙලඹුණි. කාලය කෙමෙන් ගත වෙද්දී පෘථිවියෙන් පිටත සංසිද්ධි විස්තර කිරීමට අයිසැක් නිව්ටන්ගේ භෞතික විද්‍යාව ප්‍රමාණවත් නොවීය. ඇල්බට් අයින්ස්ටයින්ගේ ක්ෂුද්‍ර භෞතික විද්‍යා අදහස් හා අජටාකාශ භෞතික විද්‍යාව නිසා මිනිසාට සඳතරණය හා ග්‍රහලෝක වලල්ලෙන් ඔබ්බට යානා යැවිය හැකි විය.

මෙවන් දියුණුවක් තිබුණත් නොවිසඳුණු සංසිද්ධි රැසක් නැවත අප හමුවේ ඇත. මේවාට ඔවුන් තුළ පිළිතුරු විරලය. ඉතා දියුණු රටවල් මෙන් අසල්වැසි ඉන්දියාව පවා අජටාකාශ ව්‍යාපෘති උදෙසා විශාල මුදල් සම්භාරයක් යොදවන නුමුදු බහුතරයක් මන්ද පෝෂණයෙන් හා ආහාර හිඟයෙන් පීඩා විඳිති. බිලියන ගණනින් මුදල් අවිආයුධ හා එහි තාක්ෂණික දියුණුව උදෙසා වියදම් කරන ප්‍රජාතන්ත්‍රවාදී සම්මත පාලන තන්ත්‍රයන් සෞඛ්‍ය ප්‍රවර්ධන උදෙසා ඉතා අල්ප මුදලක් යොදවයි.

පාරම්පරික කෘෂිකර්මයක් හා ඉතාමත් සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවක් උරුම වූ ප්‍රෞඪ ජාතියක් වූ ශ්‍රී ලාංකිකයන් දූන් දූන් ඉතා බරපතළ ලෙස රෝගී වී ඇත. අන්තර් ජාතිකව කෘත්‍රිම ජාන තාක්ෂණයෙන් නිෂ්පාදනය වූ බීජ තාක්ෂණය හා ඒ ආශ්‍රිත සමාගම් ලංකාව පුරා ව්‍යාප්තව ඇති අතර අවම වශයෙන් දේශීය ඇත්දළ බණ්ඩක්කා ඇටයක් සොයාගත නොහැකි තැනට රටේ කෘෂිකර්මාන්තය පහත වැටී ඇත.

වසර දෙදහසක් පමණ රජරට ප්‍රදේශයේ වී ගොවිතැන සරුසාරව කළ ද, රසායනික පොහොර භාවිත කර අඩ සියවසක් යැමට මත්තෙන් දරුණු වකුගඩු රෝගයෙන් ජනතාව පීඩාවට ලක්විය. දේශීයව සපයාගත් ඖෂධ භාවිතය තිබූ අප දේශය මිල හා අධික ලාභය පදනම් කරගත් ඖෂධ සමාගම් නිසා රට ඉතා දරුණු සෞඛ්‍ය අවදානමකට පත්ව තිබේ. තත්ත්වයෙන් පහළ හා අදිසි මිල උච්චාවච වන නිසා නියමිත ප්‍රමිතියට අවශ්‍ය භෝග නොලැබීම නිසා ජනතාව මූල්‍යමය ලෙස හා සෞඛ්‍ය අවදානමට පත්ව තිබේ.

හන්දියක් හන්දියක් ගානේ මලමූත්‍ර පරීක්ෂා කරන ස්ථාන හා වෛද්‍ය මධ්‍යස්ථාන කොතෙකුත් තිබුණත් වසංගත රෝග හා බෝ නොවන රෝග බහුලතාවෙහි අඩුවීමක් නොමැත. මූල්‍යමය වශයෙන් කෙනකු කොපමණ ඉදිරියට ගියද, ඔහු රෝගියකු නම්, ඔහුගේ පැවැත්ම ස්ථිර නැත. අද ලෝකයේ භෞතිකව කොතරම් ඉදිරියට ගියද, ඉතා ඉහළ රික්තයක් ඇති බව සමාජ ව්‍යසනවලින් වැටහේ. ඒ රික්තය අසීමිත ආශාවන් හා සරලබවින්



තොර සංකීර්ණ සමාජ රටාවෙන් තවත් පහළට ඇද දමයි. වෙළඳ ප්‍රචාරණයන් සමාජ හරපද්ධති එකිනෙක විනාශ කර තම වෙළඳ ප්‍රතිපත්ති හා මුදල කරා හඹායයි.

උක්ත විස්තර කළ කාරණ තුළ මෙවන් සමාජයක ඇති විශාල රික්ත පිරවීමට අධ්‍යාත්මයේ අවශ්‍යතාව ඉහළින්ම වුවමනාය. **හර පද්ධතිවල නැවත ආගමනය හා ආගමික සංස්කෘති වෙත අප ඉතා ඉක්මනින් නොයන්නේ නම් අප ශිෂ්ටාචාරය ඉතා ඉක්මනින් විනාශ විය හැකිය.**

සමහර විට අප මිනිස් ශිෂ්ටාචාරය විනාශ වූ පසු නැවත ඉතිරි වූ හෝ වෙනත් ග්‍රහලෝකයකට ගොස් පැමිණි ජීවි කොටස් මානව පොසිල අධ්‍යයනය කර, වඳ වූ හේතුව ග්ලූකෝස් නම් විෂ රසායනිකය වැඩිවීම ලෙස අර්ථකථන දිය හැකිය. ඒ තරමටම සීනි අධික ආහාරවලට ඇති ගිජුකම මේ සමාජය වෙළාගෙන අවසන්ය. දිනෙන් දින දියවැඩියා රෝගීන්ගේ ගණන ඉහළ යනවා පමණක් නොව ජානමය සම්බන්ධකම් ඇති, දියවැඩියාව වැළදෙන වයස ඉතා පහළට විත් පාසල් ළමයින් පවා දියවැඩියා බෙහෙත් ගන්නා තැනට පත්ව ඇත.

ඉතා දියුණු යැයි සම්මත සමාජයක් කීවත් මහරගම අපේක්ෂා රෝහලේ ඉඩමදිවන තරමට, පිළිකාව පැතිරී ඇත. මත් වතුර වෙළඳාමත්, දුම්කොළ සමාගම් සමඟ කොත්තු රයිස් කඩ මේ සඳහා ඉහළ දායකත්වය දෙමින් සිටින බව නොරහසකි. පුංචි පවුල රත්තරන් වීම නිසා ඒ රත්තරන් පවුල ජීවත් කර වීමට (කන්නට දීමට) දෙමාපියන් විදේශගත වීමෙන් දරුවන් නන්නත්තාර වී ඇති අතර ඔවුන් සැනසුම සොයා හෙරොයින්, අයිස් හා මත්පෙතිවලට ඇබ්බැහි වී ඇති බව ඛේදනීයය. රටගිය ඇත්තන් නැවත ගමරට එනවිට ඔවුනට පවුලක් නැතිව ඉහිරී ගොස්ය.

මේ සමාජ ව්‍යසනය හමුවේ ආධ්‍යාත්මිකව අවදි වූ කොටස් හා සරලව තම ජීවිතය අර්ථාන්විතව ගෙනයන කොටස් තවම අප අතර සිටියි.

**විද්‍යාත්මකව සාර්ථක මනුෂ්‍යයන් හා මූල්‍යමය වශයෙන් පමණක් සාර්ථක මනුෂ්‍යයන් හා සැසැඳීමේදී සතුට හා සැහීම යන ප්‍රධාන මානව අරමුණු ආධ්‍යාත්මිකව ලබාගත් මනුෂ්‍යයන් පමණක් සිටීම ආධ්‍යාත්මක චින්තනයේ වටිනාකම පසක් කර දෙයි.**

මොනවද අප අධ්‍යාත්මය දියුණුයි යන්නෙන් අදහස් කරන්නේ යයි කෙනකුට ඇසීමට හැකිය. අධ්‍යාත්මය යනු භෞතිකවාදයෙන් ඔබ්බට ගිය මානව චෛතසික උත්තරීතර භාවයයි. එය හුදෙක් තම අරමුණු නොකොට ප්‍රජාව හා ස්වභාව ධර්මයේ චිරස්ථිතියට යහපත් හා ඒ තුළ පුද්ගල සංවර්ධනය ලැබෙන ඵලයකි.

තම ජීවිත කාලයේම අනුභව කළ හැකි දෙමුහුන් (බටි) අඹගස් පැල කරන අඩු කලකින් වසවිස ගසා වැඩි අස්වනු හා මුදල් දෙන භෝග වවන ගොවීන් වෙනුවට උත්තරීතරව සහෝදර ප්‍රේමයෙන් ප්‍රජාව වෙත නැඹුරුව ක්‍රියා කරන්නේ නම් කොතරම් සදාචාරාත්මක ද? ආධ්‍යාත්මික ද?

අප බලාපොරොත්තු මල්පල ගන්වමින් දූන් දූන් කාබනික ගොවිතැන හා වසවිස තොර ගොවිකමටත් ඒවා පරිභෝජනය කරන සැදැහැවත් සමාජයක් නිර්මාණය වීම හොඳ සමාජ නැඹුරුවකි.

එනමුදු වසවිස පතුරුවන වෙළඳ දැන්වීම් හා බහුජාතික සමාගම් තවමත් දැවැන්ත බූවල්ලකු වෙමින් සමාජය තදින් වෙළාගෙන ඇත.

ඒ කෙසේ වෙතත් ආපසු උඩුගං බලා පිහිනීමට අප හැමදෙනාටම සිදු වී ඇත. එකා මෙන් නැගිටීමට නිසි කාලය එළඹ ඇත. **එනිසා අප මෙන් සතාසිවුපාවන්ටත් ජීවත් විය හැකි වසවිස නොමැති පෘථිවියක්, නිර්මාණය කිරීමට ජගත් පුරවැසියන් වන අපගේ, පරම ක්‍රිස්තු කැඳවීමයි.**

**සචිත මෙන්ඩිස්**
**වෛද්‍ය නිලධාරී, ප්ලාස්ටික් ශල්‍ය ඒකකය,**
**උතුරු කොළඹ රෝහල**

# නූතන පවුල් ගමන් මඟ

නූතන සමාජ රැල්ලට හසුවී වේගයෙන් ඉදිරියට ඇදීයන අප පවුල් සංස්ථාව ආපස්සට තල්ලු වී යෑමේ ඛේදජනක ඉරණමකට පත් වී ඇති බව පැහැදිලිය. ඒ පසුබැසීමට හේතුවන විවිධ කරුණු කාරණ ගෙනහැර දැක්විය හැකිය. අතීත පවුල් ජීවිත රටාව වෙනුවට තරඟකාරී ජීවිත රටාවකට අවතීර්ණ වීම ඒ විනාශකාරී තත්ත්වයට මූලික වී ඇත.

එදා දරුවන් හය හත් දෙනකුගෙන් සමන්විත වූ කිතුනු පවුල තුළ තිබූ සමගිය, සංහිඳියාව, ප්‍රීතිය, නිදහස අද පවුල් තුළ ඇත්තේම නැති තරම්ය. දරු පවුල රැක ගැනීමට මවට පියාට එතරම් වෙහෙසක් දැරීමට සිදුවූයේ නැත. පියා උපයන මුදලින් අරපිරිමැස්මෙන් වියපැහැදම් කිරීම මවට එතරම් අපහසු කාර්යයක් නොවීය. දරුවන්ට දකින දකින දේ සිතන පතන දේ නොව අත්‍යවශ්‍යම දේ පමණක් ලබා දීමට තරම් මව බුද්ධිමත් විය. පවුල කෙතරම් බරපතළ වූවත් මවට රැකියාවක් කිරීමේ අවශ්‍යතාවක් ඇති නොවීය. බතක්, මැල්ලුමක්, එළවළුවක් සමඟ කරවල කෑල්ලක් සමඟ සූදානම් කළ ආහාර වේලට කිසිදු රසකාරකයක් හෝ වර්ණකයක් මුසු නොවූයේ ගෙවත්තේ පලා, එළවළු, කොස්, දෙල් ආහාර වේලට එක් වූ නිසයි. ගලේ අඹරාගත් කහ, මිරිස් හා අනිකුත් කුළුබඩු ආහාරය රසවත් කළේය. එසේම උණ, සෙම්ප්‍රතිශ්‍යාව වැනි සුළු අසනීප සඳහා සාම්ප්‍රදායික අත්බෙහෙත් භාවිත කර සුවය ලැබීය. **තම මහලු මව්පියන් රැකබැලීමට, උපස්ථාන කිරීමට මව සහ දරුවන්ට අවස්ථාව උදාවිය. අසල්වැසියන් සමඟ සාමයෙන් ප්‍රීතියෙන් ජීවත් වූහ. නින්දට පෙර සුරුවම් කුඩුව ඉදිරිපිට පැදුර එලා ජපමාලය, රාත්‍රී යාච්ඤා උච්චාරණය කිරීමට පවුලේ සියලු දෙනාම අම්මා එකතු කරගත් අන්දම තවමත් සිහියට නැගෙයි.**

විවාහයට පෙර විවාහ අපේක්ෂකයන් සඳහා සභාව මඟින් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත් වූවත් එය ක්‍රියාත්මක කරන්නේ ඉතා සුළු පිරිසකි. දරු පිළිසිඳගැනීම වළක්වා ගනිමින් තම ආර්ථිකය ශක්තිමත් කර ගැනීමට වසර ගණනාවක් ගත කරයි. දරුවකු ගැන සිතීමට පටන් ගන්නා විට බිරිඳගේ සරු කාලය ඉකුත් වීමට ආසන්නය. එහෙයින් පවුලකට සතු වන්නේ එක් දරුවකු හෝ දෙදෙනෙකි. ඔවුන් හට කිසිදු අගහිඟකමක්, දුකක්, කරදරයක් නොදී හදා වඩා ගැනීමට මව හා පියා වෙහෙසෙති. දරුවා උසස් පාසලකට ඇතුළු කිරීමට ලක්ෂ ගණන් මුදල් වැය කරති. පාසල් ගාස්තු, ප්‍රවාහණ ගාස්තු ගෙවීමට සිදුවෙයි. ළදරු



පාසලේ පටන් පිහිනුම් පන්ති, නැටුම් පන්ති, සංගීත පන්ති, කරාටේ ජූඩෝ පන්ති, ක්‍රිකට් පන්ති සඳහා දරුවා යොමු කරන්නේ තරඟකාරී ජීවන රටාව තුළ තම දරුවා ඉහළින්ම තබන්නටයි. පාසල් යන දරුවාගේ උදය ආහාරය වසවිස, රසකාරක අඩංගු කෙටි ආහාර සහ බීම වර්ගයි. මව පියා දෙදෙනාම රැකියාවේ නියුතු වීමට අවශ්‍ය බැවින් නිවසේ ආහාර පිසීමක් නැත. ඒ වේලත් පිටින්ම ලබා ගැනීමට සිදුව ඇත. එනිසා වකුගඩු රෝග, පිළිකාව, දියවැඩියාව වැනි රෝගවලට ගොදුරුවීමේ ප්‍රවණතාව වැඩි වී ඇත. එසේම සුළු

අසනීපයකදී පවා විශේෂඥ වෛද්‍ය සේවයට යොමුවීම හා පෞද්ගලික රෝහල්වලට ඇදී යෑමද විලාසිතාවක් වී ඇත.

මුළු ජීවිතයම දරුවන් වෙනුවෙන් කැපකර තම මහලු ජීවිතය විවේකයෙන් ගත කිරීමට පුන පුනා සිටින අසරණ මව්පියන්ට මුනුබුරු මිනිබිරියන් රැක බලා ගැනීමේ කාර්යය පවරා ඇත. දරුවන්ට ආදරය කිරීමට වේලාව දෙමාපියන්ට නැත. ආගම දහම ගැන කියාදීමට හැකියාවක් නැත. සාන්ත කුරුසියේ පටන් යාච්ඤා සියල්ල කියාදීම දහම් පාසලට භාර දී ඇත. නිවසේද යාච්ඤා කිරීමට වේලාව නැත. නූතන කිතුනු මව්වරුන් සවස් වී එන විට රූපවාහිනිය ඉදිරිපිට අසුන් පනවා දරුවන්ට ආරාධනා කරන්නේ පැය ගණන් දිග හැරෙන ටෙලිනාට්‍ය නැරඹීමටයි. ඒ හැර අන්තර්ජාලයේ සැරිසරමින් පැය ගණනින් කාලය කා දරුවෝ ද අම්මාගේ ආදර්ශය අකුරටම පිළිපදිති. සමහර මව්වරු තම අඟපසඟ විවෘත කර පෙන්වන විකාර ඇඳුමින් සැරසී තම තරුණ දූ දරුවන්ට පවා නිග්‍රහ කරති. දරුවන්ට හොඳ නරක, යහපත් ගතිපැවතුම් කියා දීමට තරම් වැඩිහිටිකමක් ඔවුන් තුළ නැත. සමහර අම්මලා දරුවන්ටත් වඩා බොළඳය. ලද පමණින් සතුටු වීම, දිව්‍ය සංරක්ෂණයට භාර වීම, දේව කැමැත්තට නතු වීම, පවුල් යාච්ඤාව එදා සමාජය තුළ පැවති ශ්‍රේෂ්ඨ ගුණාංගයි. කොතෙක් ආර්ථික අපහසුතා මධ්‍යයේ වුවද අනෙකා පරයා හඹායන තරඟකාරී සමාජය තුළ නූතන කිතුනු පවුල් සංස්ථාව විනාශ මුඛය කරා ගමන් කිරීම අතිශයින් ශෝචනීයය.

ඩල්සි මෙන්ඩිස්
වැලිකුරුඳුවත්ත

# භක්ති ප්‍රබෝධනය ඉදිරි තේමාවන්

**2020 පෙබරවාරි මාසය - "නිදහස වගකීමකි"**

**2020 මාර්තු / අප්‍රියෙල් - "එතෙර වී ගැලවෙමු"**

හිතවත් ලේඛක / පාඨක හැම වෙත,

"භක්ති ප්‍රබෝධනය" සඟරාවේ ගුණාත්මකභාවය වැඩි කිරීමට අර්ථාන්විත, භාෂාව නිවැරදිව හසුරුවමින්, අදාළ තේමාවට ලියන ලිපි හැකි ඉක්මනින් අප වෙත එවන්න. "භක්ති ප්‍රබෝධනය" උන්නතිය සඳහා ඔබ කරන යෝජනා / විවේචන අපට අස්වැසිල්ලකි.

**සංස්කාරක පියතුමා,**
**"භක්ති ප්‍රබෝධනය" අංක 265, ඩීන්ස් පාර, මරදාන, කොළඹ 10.**
ඊමේල් : bprabodanaya@gmail.com

# අධ්‍යාපනය හා අධ්‍යාත්මය (ප්‍රතිපදාව)

අධ්‍යාත්මය යනු කුමක්ද? අධ්‍යාත්මය යනු සරලව කියන්නේ නම් ප්‍රතිපදාව යි. එය නිර්වචනය කර ගැනීමේ හා අවබෝධ කර ගැනීමේ බහුවිධ ප්‍රවේශ ඇති නමුත් මෙහි දී අවධාරණය කරන්නේ ශුද්ධ වූ ලියවිල්ල මත පදනම් ව ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් අනුව එය තේරුම් ගැනීමයි. ඒ අනුව ආධ්‍යාත්මිකත්වය **"තමාගේ අසල්වැසියාට කරන සේවය තුළින් දෙවිඳුන්ට සේවය කිරීම" (මතෙව් 22:38-40) ලෙස උන්වහන්සේ මුළු ශුද්ධ වූ ලියවිල්ල ම සාරාංශ කළ සේක.** ජේසුස් වහන්සේ, **"දෙවි සමිඳාණන් වහන්සේට ඔබේ මුළු හෘදයෙන් ද ඔබේ මුළු සිතින් ද ඔබේ මුළු වීර්යයෙන් ද ප්‍රේම කළ යුතු ය" (ද්වි 6:5) සහ "නුඹ නුඹට ප්‍රේම කරන ලෙස ම නුඹේ අසල්වැසියාටත් ප්‍රේම කළ යුතු ය" (ලෙවී 19:18)** එලෙස ඒකාබද්ධ කළසේක. ඒ අනුව මේ කේන්ද්‍රීය ඉගැන්වීම මග හැර යන අධ්‍යාත්මය ව්‍යාජයකි. ශු. පාවුලු තුමා මෙය තව දුරටත් මෙසේ පැහැදිලි කරයි. **"එකිනෙකාට ප්‍රේම කිරීම හැර අන් කිසිවක් ගැන කිසිවකුට ණය ගැති නොවන්න.** මන්ද, කාමමිථ්‍යාචාරය නොකරන්න, මිනී නොමරන්න, සොරකම් නොකරන්න, ලෝභ නොවන්න යන ආඥා ද තවත් අමතර ආඥා ඇත්නම් ඒවා ද "නුඹ නුඹට ප්‍රේම කරන ලෙස නුඹේ අසල්වැසියාටත් ප්‍රේම කරන්න" යන පාඨයෙහි සම්පිණ්ඩනය වී ඇත. ප්‍රේමය අසල්වැසියාට නපුරක් නොකරයි. එබැවින් ප්‍රේමය නම් ව්‍යවස්ථාව සම්පූර්ණයෙන් ඉටුකිරීමය **(රෝම 13:8-10).** මේ ආඥා ව පිළිපැදීමට කළ කැඳවීම බව්තීස්මය තුළින් ශපථ කළ නිසා ඔබ සහ මම කිතුනුවෝ වී ඇත්තෙමු. එබැවින් අපගේ සහ දරුවන්ගේ හැඩගැස්වීම සහ ගොඩනැංවීමේ පදනම වන අධ්‍යාපනය මෙය මග හැර යා නම් ඉන් ලැබෙන අයහපත් ප්‍රතිඵල ගැන අප පුදුම විය යුතු නැත. අපි ඒ ගැන විමසා බලමු.

අධ්‍යාපනය යනුවෙන් විවිධ නිර්වචන, විග්‍රහ තිබෙන නමුත් මෙහිදී සැලකිල්ලට ගනු ලබන්නේ දාර්ශනිකයකු, මනෝවිද්‍යාඥයකු හා අධ්‍යාපන ප්‍රතිසංස්කරණවාදියකු මෙන් 20 වන ශතවර්ෂයේ මුල්භාගයේ විසූ ශ්‍රේෂ්ඨ බුද්ධිමතකු, චින්තකයකු ලෙස සැලකෙන ජෝන් ඩේවි (John Davy 1859-1952) ඉදිරිපත් කල විග්‍රහයකි. එතුමාට අනුව අධ්‍යාපනය සමාජ ක්‍රියාවලියකි. එය **"අනාගත ජීවත්වීම සඳහා සූදානම් කිරීමක් නොව ජීවත්වීමකි"** (a process of living and not a preparation for future living) ඒ අනුව අධ්‍යාපනය ලබා දෙන්නා ලබාගන්නාවූ යම් වස්තුවක් ලෙස සලකා ඔවුන් මත ක්‍රියාකිරීමක් නොව ඔවුන් සමග සහක්‍රියාවකි. එහිදී ශික්ෂකයාගේ කාර්යය වන්නේ ශිෂ්‍යයාගේ විභවය මතුකර ගැනීම සහ සංවර්ධනය කිරීමයි. ඩේවීගේ විග්‍රහය අප භාරගන්නේ නම් අධ්‍යාපනය ජීවිතය ජීවත්කරවිය යුතු අතර කෙනකුගේ ශාරීරික, මානසික, චෛතසික සහ ආධ්‍යාත්මික ප්‍රගමනය සඳහා එය තෝතැන්නක් විය යුතුය. ජීවිත අරමුණු, පරමාර්ථ මානව වටිනාකම් පාදා ගනිමින් ඒවා තහවුරු කරගැනීමේ ගමනක සිසු සිසුවියන් මෙන්ම වැඩිහිටියන් ද රැගෙන යා යුතුය. ඒ අනුව දරුවකු ආධ්‍යාත්මිකව ගොඩ නැංවීම අධ්‍යාපනයට බාහිරෙන් ආලේප කිරීමක් හෝ පූට්ටු කිරීමක් නොව එයටම කා වැදුණු කාරණයකි.

මේ අදහස තවදුරටත් ඩැනියල් ගෝල්ඩ්මන් සහ පීටර් සෙන්ගේ "ත්‍රිත්ව යොමුව අධ්‍යාපනයට නව ප්‍රවේශයක්" (Triple Focus : A New Approach to Education) කෘතියේ ඉදිරිපත් කෙරේ. ඇතුළත, අනිකා සහ බාහිර ලෝකය උක්ත යොමුවීම් තුන ය. අපගේ ජීවිත අරමුණ සහ ගැඹුරුතම අභිලාෂ සමග සම්බන්ධ කරගැනීම මෙන්ම, අපගේ හැඟීම් තේරුම් ගැනීම හා ඒ හැඟීම් සම්බන්ධව අප කුමක් කළ යුතුද යන්න අවබෝධ කරගැනීම අභ්‍යන්තර ලෝකය යන්නෙන් අදහස් කෙරේ. එමෙන්ම අභිප්‍රාය සපිරි ජීවිතයක මෙන් අප හමුවේ ඇති කාර්යය කෙරෙහි අවධානය යොමුකිරීම,

ව්‍යාකූලත්වයන් මගහරවා ගැනීම මෙන් චිත්තවේග කළමනාකරණය කරගැනීමේ යතුර ඔවුන්ට අනුව ඇතුළත යොමුව උසුලයි.

අන් මිනිසුන් වෙත හැරීම හෝ සහකම්පනය, තව කෙනකුගේ යථාර්ථය ඔහු දකින ආකාරයෙන් තේරුම්ගැනීම සහ සම්බන්ධවීම දෙවැනි යොමුවේ අරමුණයි. එවන් සහකම්පනයක් කරුණාහරිත බවකට සහ සාමූහිකව වැඩකිරීමේ කුසලතාවකට කෙනකුව යොමු කරවයි. එලදායි සමීප සබඳතාවල යතුර ඇත්තේ එතැනයි. තෙවන කරුණ බාහිර ලෝකය තේරුම් ගැනීමයි.

ඩැනියල් ගෝල්ඩ්මන් ලා මෙතුළින් මතුකරන්නේ පූර්ණ අධ්‍යාපනය මිස හුදු දැනුම කේන්ද්‍රීය කාරණයක් නොවන බව පැහැදිලිය. එහෙයින් සැබෑ අධ්‍යාපනය සැබැවින් ආධ්‍යාත්මිකය. එය පෝෂණය කරයි. පූර්ණ මිනිසකු බිහිකිරීමට මඟ පාදයි. ඔබගේ දරුවාට, මාගේ දරුවකුට සමාජයේ හැම දරුවකුට එවන් අධ්‍යාපනයක් ලැබීම අයිතියක් නම් පවතින අධ්‍යාපන පද්ධති සහ ඒ හා බැඳුණු හැම කාරණයක් එනම් විෂයමාලා ද, ගුරු පරපුර ද ඇතුළත්ව විවේචනාත්මක විග්‍රහයකට ලක්කර යුතුමය. එමෙන්ම මේ පද්ධතීන් සමාජයට නිදහස් කරන දරුවන්ව හෙළා දැක ප්‍රශ්න කරනු වෙනුවට එම පද්ධති ප්‍රශ්න කළ යුතුය. එය ආගමික සහ දහම් පාසල් අධ්‍යාපනයට ද අදාළ බව අවධාරණය කළ යුතුය. පහත සඳහන් පද පෙළ අපට එය මැනවින් පසක් කර දෙයි.

**ළමයින් උගන්නේ ජීවිතයෙනි.**

ලේඛිකාවක්, පවුල් උපදේශිකාවක් වූ ඇමරිකානු ජාතික ඩොරති ලෝ නොල්ටේ 1954 දී "ළමයින් උගන්නේ ජීවිතයෙනි" නමින් කවියක් පබැඳුවා ය. 1998 දී එය රේෂල් හැරිස් සමග එකතු වී පොතක් ලෙස එළි දැක්වූවා ය. පහත පෙළ ගස්වා ඇත්තේ ඒ පද පෙළයි.

දෝෂාරෝපණයට ලක්වන ළමයි
හෙළා දකින්නට උගනිති
සතුරුකමට බඳුන්වන ළමයි
අරගල කරන්නට උගනිති
බියෙන් පෙළෙන ළමයි
සැකයෙන් ජීවත්වීමට උගනිති
අනුකම්පාවට බඳුන්වන ළමයි
ආත්මානුකම්පාවෙන්
පෙළෙන්නට උගනිති
අපහාසයට බඳුන්වන ළමයි
ලජ්ජාවෙන් හැකිලීමට උගනිති
ඊර්ෂ්‍යාවට බඳුන්වන ළමයි අනුන්ට
ඊර්ෂ්‍යා කිරීමට උගනිති
ලජ්ජාවට බඳුන්වන ළමයි වරදකාරී
හැඟීමෙන් පෙළෙන්නට උගනිති

දිරිදීමට බඳුන්වන ළමයි
ආත්ම විශ්වාසය උගනිති
ඔරොත්තු දීමට හැකි පරිසරයක
වැඩෙන ළමයි ඉවසීම උගනිති
පැසසුමට ලක්වන ළමයි
අගය කරන්නට උගනිති
පිළිගැනීමට බඳුන්වන ළමයි
ආත්ම ගෞරවය උගනිති
අනුමතියට ලක්වන ළමයි
තමන් අගය කරන්නට උගනිති
ප්‍රසාදයට ලක්වන ළමයි ජීවිතයට අරමුණක්
තිබීමේ වැදගත්කම උගනිති
බෙදා හදාගන්නා පරිසරයක වැඩෙන ළමයි
ත්‍යාගශීලීත්වය උගනිති
අවංක පරිසරයක ජීවත්වන ළමයි
සත්‍යවාදී වෙති
සාධාරණත්වයට බඳුන්වන ළමයි
යුක්තිසහගත වන සැටි උගනිති
කාරුණික පරිසරයක වැඩෙන ළමයි
ගෞරවය උගනිති
සුරැකි පරිසරයක වැඩෙන ළමයි
විශ්වාසය තැබීමට උගනිති
මිතුරු පරිසරයක වැඩෙන ළමයි
ලෝකය ප්‍රසන්න ස්ථානයක්
බව උගනිති

අපගේ පාසල්, නිවෙස්, අනිකුත් ආයතන සහ සමස්ත සමාජය උක්ත මිනුම්දඬුවලින් නිරීක්ෂණය කරන විට අපට පෙනී යන්නේ කුමක් ද? ඒවා කෙතරම් දරුවන්ට හිතකර ද? ඔවුන්ව පූර්ණ මානවයන් ලෙස ගොඩනැංවීමට අවශ්‍ය පරිසරය එහි තිබෙනවා ද? එසේ නම් දරුවන්ගේ වැරදිවලට ඔවුන් චූදිතයන් කිරීම කෙතරම් සාධාරණ ද? එමනිසා අප විමසා බලන මාතෘකාවට අදාළ හෙයින් 2017 වර්ෂයේ දී ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය විසින් පාසල් තුළ දරුවන් විනයගරුක කිරීමට යොදාගන්නා ක්‍රම පිළිබඳ කළ සමීක්ෂණ ප්‍රතිඵල ගැන අවධානය යොමු කළ යුතුය. (මෙහි සම්පූර්ණ වාර්තාව පහත නමින් අන්තර්ජාලයේ කියවිය හැකිය (A Study on Child Disciplinary Methods Practice in Schools in Sri Lanka). ඒ වාර්තාවට අනුව සමීක්ෂණයට භාජනය වූ නියැදියෙන් 80.4% ශාරීරික දඬුවම් අත්විඳ ඇති අතර 53.2% ශාරීරික අපයෝජනයට ලක් වී තිබේ. එමෙන් 72.5% මානසික පරිභවයට පාත්‍රව ඇත. හිංසනය ඇති තැන එය මුදා හරින හේතුව කුමක් වූව ද එය ප්‍රේමයට පටහැනිය. කිසිම අයුරකින් ආධ්‍යාත්මික නොවේ.

ගුරුවරයකු, කෘතහස්ත ලේඛකයකු වන කරුණාතිලක හඳුන්පතිරණයන් ගේ "පාසලක් වේ නම් යම්" කෘතියට හැඳින්වීම ලියන මහාචාර්ය ලියනගේ අමරකීර්ති මෙසේ පවසයි, " හඳුන්පතිරණගේ "සත්‍ය සුන්දර ද?" කෘතිය මගින් මෙන් ම "නොලියා ම බැරි නිසා" තුළින් ද කෙරෙන්නේ පාසල නම් වැදගත් ආයතනයට දැන් සිදුවී ඇත්තේ කුමක්දැයි අපට දැනගන්නට සැලැස්වීමයි. මේ අසුන්දර සත්‍යය හෙළි කරන කෘති දෙකට ලැබුණ හා තවමත් ලැබෙමින් පවතින ප්‍රතිචාරවල වැදගත් කරුණු ඇතුළත් කර තුන්වැනිව මේ "පාසලක් වේ නම් යම්"කෘතිය ඔහු ලියා තිබේ. ඒවා ඔහුගේ ඍජු අත්දැකීම් නොව පාඨකයන් වෙතින් ලැබුණු සංවේදී කතා ඇසුරින් ලියූ ඒවාය. මේ "පාසලක් වේ නම් යම්" කියවන විට අපට හැඟෙන්නේ ඔහුගේ ඉහත කී කෘති දෙකින් හෙළි කළ සත්‍යය හුදෙක් ඔහු අත්දැකීම් ලත් පාසල් කීපයට පමණක් සීමා වූ ඒවා නොව සමස්ත පාසල් පද්ධතියට අඩු වැඩි වශයෙන් ගැලපෙන සත්‍යය අනාවරණයක් බව ය."

**අධ්‍යාපනය ආධ්‍යාත්මික වීමට නම්,**

වර්තමානයේ ඔබත් මාත් ජීවත්වන්නේ රෝගී සමාජයක ය. එහි රෝගීහු ද, රෝහල් ද, සොරකම් ද, අපරාධ ද, අපරාධකරුවෝ ද, සිරකරුවෝ ද වැඩිවෙමින් පවතිත්. උත්ප්‍රාසිකව ඒ අපරාධකරුවෝම මේ ව්‍යසනවල මිදුම්කරුවෝ ලෙස ජනතාවගේ වන්දනාවට පාත්‍ර වී ඇත. කනගාටුවට මේ හැම කෙනෙක්ම පාසල් හෝ වෙනත් ආයතනයකින් හෝ අධ්‍යාපනයක් ලැබූවෝ වෙති. එබැවින් පාසල සහ අතිශයින් ගුරු භූමිකාව අත්‍යන්තයෙන්ම පරිවර්තනයකට ලක්විය යුතුය. ඒ සඳහා අව්‍යාජ බුද්ධිමතුන්ගේ, චින්තකයන්ගේ මැදහත්වීම අත්‍යවශ්‍ය ය. අනික් අතට මේ පද්ධති වෙනස් වන හෝ කරන තුරු බලා නොසිට ඔබේ දරුවාට මෙන් අනික් දරුවන්ට පූර්ණ අධ්‍යාපනයක් ලබා දීමට වෙහෙසීම සහ ඒ සඳහා වෙනස්වීම අප හැම කැඳවීම ලබා ඇති ආඥාව වන අසල්වැසියාට ප්‍රේමකිරීමට යටත් බව සිහි තබා ගනිමු.

**දීප්ති සිල්වා**
**ප්‍රජා සංවර්ධන ක්‍රියාධර**

පරිශීලනය

**Mysticism of Service** -
ගරු ඇලොසියස් පීරිස්
ජේ. නි. පියතුමා, තුලන, කැළණිය

දරුවන්ගේ ලෝකය -
ධනපාල ගුණසේකර,
විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, කොළඹ

පාසලක් වේ නම් යම් -
කරුණාතිලක හඳුන්පතිරණ,
විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, කොළඹ

අන්තර්ජාලය

# ඕං එහෙනං



විස්සයි විස්සේ මැච් එක ගහලා දහනවයේදීම ඉවර වුණා
දහනම ගෙවුණා, විස්සත් ලැබුවා අපිත් වසරකින් නාකි වුණා
හෙට උපදින උන් බලං ඉන්නවා කිරිබත් කිරිපැණි පිළුණු වුණා
නූපදින එක හොඳයි කියලා මගෙ කට විවර වුණා

නත්තල් ආවා, අවුරුදු ආවා පොකැට්ටුවට අනේ තට්ටු වුණා
පොත් ලිස්ට්, යුනිෆෝම්, සපත්තු ගන්නට දෙවියන් වඳින්න සිද්ධ වුණා
දෙයියොත් කියලා මොනවා කරන්න ද වැරැද්ද අපටම පත්තු වුණා
කනකර තිබ්බා ජාමේ බේරුණා හරි සන්තෝෂයි සතුටු වුණා

වසරක් නිම වී වසරක් ලබද්දී කුස්සිය මුල්ලත් අලුත් වුණා
ලිපගිනි මොළවා කිරිබත් උයන්න වටින කියන දේ සිද්ධ වුණා
අලුත් සකසු පියතුමෙක් ඇවිල්ලා හැම තැන කසුකුසු පතළ වුණා
සිරිලක ඉපැරණි සඟරාවට දැන් අළුත් කාලයක් උදා වුණා

ගෙන්ගෙට යන්නට වරම් ලැබේවා මංගල නැකතත් උදා වුණා
පුබුදන කුමරිය පැතු ඒ කුමරා ගෙයි එළිපත්තට ළඟා වුණා
දීගේ අපුරුයි මාගේ කියලා නිකා හිතට සිත් පහළ වුණා
කසාදේ දික්කර නොම ගෙන යන්නට දෙවියන් උඩසිට පිහිට වුණා

තවටික කලකින් ජුබිලිය එනවා පස් වසරයි තව ඉතිරි වුණා
ඒ පස් වසරත් විදුලි වේගයෙන් නිමවන බව නම් පසක් වුණා
ජුබිලිය නිමිත්ත කරගෙන වැඩ දැක පුබුදන කුමරිය සතුටු වුණා
ඒ ගැන සිතන්න සකසු මඬුල්ලට දුරදිග නුවණක් පහළ වුණා

- සූරිය -

# ආගමික අධ්‍යාපනය සහ අධ්‍යාපනයේ ධර්මය

ආගමික අධ්‍යාපනය පිළිබඳව පශ්චාත් නූතන අවධියේ වැඩි කතාබහක් ඇති වූයේ ඇමරිකා එක්සත් ජනපදය කේන්ද්‍රීය කොට ගෙන බව පැහැදිලියි. එයට හේතුවක් වූයේ 1965 ට පසු විශේෂයෙන් කතෝලික සභාව තුළ ඇති වූ නවෝදයයි. වතිකාන කතිකාව හරහා එළිදැක්වුණු වටපිටාව හමුවේ සභා කේන්ද්‍රීය අධ්‍යාපනයට වඩා ආගමික අධ්‍යාපනයේ නව නැමියාවක් උත්පාද කිරීමේ ප්‍රශස්ත ව්‍යායාමයක නිරත වූ ආධ්‍යාත්මික අධ්‍යාපනඥයන් දෙදෙනකු ලෙස මරියා හැරිස් සහ ගේබ්‍රියෙල් මොරාන් නම් කළ හැකියි.

ඔවුන්ගේ අප්‍රතිහත ව්‍යායාමය වූයේ ආගමික අධ්‍යාපනය තුළ දරුවාගේ කුතුහල මනස සුවපත් කරමින් අධ්‍යාපනයේ ධර්මය මතු කර ගැනීමයි. විශේෂයෙන් කතෝලික අධ්‍යාපන ක්ෂේත්‍රයේ සිට විමර්ශනාත්මකව නෙත් යොමු කරන්නකුට මෙය අවබෝධ කර ගැනීම එතරම් අපහසු වන්නේ නැත. 1961 දී කතෝලික පාසල් රජයට පවරා ගත් පසු බෙදී ගිය රේඛීය තලයක් ඔස්සේ පවරාගත් පාසල් සහ පෞද්ගලික පාසල් අතර පැහැදිලි බෙදීමක් ඇති වූ බව නොරහසකි. පවරාගත් පාසල් තුළ ආගමික අධ්‍යාපනය මිලාන

දි දී වී ගිය අතර පෞද්ගලික පාසල්වල අධ්‍යාපනයේ ධර්මය පිළිබඳව විශාල රික්තයක් ඇති වන්නට විය.

අධ්‍යාපනයේ ධර්මය දෙස නෙත් යොමු කළ විට පැහැදිලි විය යුත්තේ ක්‍රිස්තුන් වහන්සේගේ ධර්මතාවේ පදනමයි. එනම් ''ජීවිතය ලැබෙන පිණිස සහ එය සපුරා ලැබෙන පිණිස'' (ජොහාන් 10/10) යනුවෙන් ප්‍රකාශ කළ ආගමික ආප්තෝපදේශයක් බඳු සත්‍යතාවේ දැක්ම අධ්‍යාපනයෙන් නැති වී ගිය සඳ ලත් තැනම ලොප් වූ ධර්මතාව අද පැහැදිලිව ප්‍රශ්නාර්ථයක් ඉතිරි කර ඇත. මන්දයත් සපුරා ජීවිතය ආගමික අධ්‍යාපනයෙන්ද අධ්‍යාපනයේ ධර්මයෙන්ම මගහැරී ඇති නිසා අද්‍යතන කතෝලික සමාජය, සමාජීය පවුල් සහ සමූහ මට්ටමින් මෙන්ම පදවි හා ජාතික මට්ටමින් ද බිඳුණු බව බෙදී වෙන් වී සිටීම හා දුරස්ථභාවය පැහැදිලිවම දක්නට ඇත. ක්‍රිස්තුන් වහන්සේගේ ජීවනාලෝකය, ඉරිතැළී ඇති සමාජ රටාවක දැකිය නොහැකි වී ඇත්තෙත් ඒ නිසා විය යුතුය.

තමන් කවුද? යන ප්‍රශ්නය නිරන්තරයෙන් ඇසෙන සමාජයක පෞද්ගලික මට්ටමින් සලකා බලන කළ අද අනන්‍යතාව පිළිබඳ විශාල අර්බුදයකට අපි මුහුණ දී සිටිමු. පරම්පරාගත සම්ප්‍රදායේ අක්මුල්වලින් අපි මිදී ඇති බවක් දැනෙන්නෙමු. වුවමනා පිළිබඳ ප්‍රශ්නය පෙරට වඩා ප්‍රශ්න සහගතව ඇසෙන අතර සිත් තැවුල, අනපේක්ෂිත තත්ත්වය සහ අවිශ්වසනීය බව නිසා සම්බන්ධතා අතර මෙන්ම පවුල් සබඳතා අතරත් ඇති අනපේක්ෂිත බව නිසා කවුරුනුත් වැරදිකාර හැඟීම් වලින් පෙළෙන්නට පුරුද්දක් ඇති කර ගෙන ඇති බවක් දැනේ. තනිකම විශාල ප්‍රශ්නයකි. ඉච්ඡා භංගත්වය දිනෙන් දින මිනිස් ජීවිත අතර ඉහළ අගයක් පෙන්නුම් කර ඇති නියාවක් පෙනේ. මානව උත්තරීතරතාව අහිමි කළ ජනයා අප අතර කොතෙකුත් ඇති හෙයින් අධ්‍යාපන සහ රැකියා අවස්ථා නොමැති ජනයා මහත් දුකට පත්ව ඇති බවක් විද්‍යමාන වේ. මේ අතර අධ්‍යාපනයෙන් හා වරප්‍ර සාදවලින් අනූන සුළුතරයක් ඔවුන්ගේ සුබ විහරණය වෙනුවෙන් සමාජයේ සම්පත් පරිහරණය කරමින් ජීවත් වෙති.

අධ්‍යාපනය තුළ ඉච්ඡාභංගත්වයේ කැරලිකාර ස්වරූපය ඉස්මතු වූයේ වරක් දෙවරක් නොවේ. 1971 තරුණ කැරැල්ල සහ 1988 - 89 භීෂණය ඊට ආසන්නතම හොඳම නිදර්ශන වී ඇත. චින්තනයක් හෝ දර්ශනයක් බිහිකර ගැනීම මත, අධ්‍යාපනයේ වර්තමාන තත්ත්වය පැහැදිලි ලෙසම අභියෝග රැසක් මෙන්ම අර්බුද රැසක් ද නිර්මාණය කර ඇත. ඒ නිසා සමාජ සහ දේශපාලන මට්ටමින් පරිපාලන ආයතන, අධ්‍යාපනයේ ක්‍රමය, උසස්

අධ්‍යාපනය සහ අනිකුත් ශුභසාධන ආයතන දිනෙන් දින පිරිහෙමින් පවතින අතර, ඒවා යහපත් තත්ත්වයට පත් කිරීමට නිසි බලධාරීනට දර්ශනයක් හෝ හැකියාවක් නැති බව පෙනේ. මීට අමතරව විවිධ ජන කොටස් අතර ඇති වී තිබෙන විරසක බව ප්‍රචණ්ඩත්වය කරා ශීඝ්‍රයෙන් ගමන් කරමින් තිබෙන බවක් ද ගම්‍ය වෙමින් පවතී.

තත්ත්වය එසේ පවතී නම් ආගමික අධ්‍යාපනයක් සහ අධ්‍යාපනයේ ධර්මයක් තුළින් මේ බෙදීයාමට ඉරිතැළීමට පිළියමක් සොයාගත නොහැකි බවක් පෙන්වා ඇත්ද? කතෝලික සමාජ දර්ශනය තුළ ආගමික අධ්‍යාපනය ගැඹුරින්ම තත්ත්ව කාරණයක් හා ප්‍රමිති කාරණයක් වී තිබුණේ නම් ජීවත් වන අසල්වැසියා සමඟ සහභාගීලි බවින් සුවපත් කරවීමකට සහ යථාර්ථය බෙදා හදා ගැනීමකට දෙවියන් වහන්සේ සමඟ බද්ධ වීමකට හොඳටම අවකාශය සැදී තිබිය යුතුයි. අධ්‍යාපනයේ පුළුල් බව තුළින් ගොඩනැඟෙන ධර්මතාව ආගමික මුහුණුවර තුළ විචිත්‍ර ගැන්වීම හරහා එකී සිද්ධාන්ත තුළ අක්මුල් හඳුනා ගැනීමක් ඇති කර ගත යුතුමය. ශුද්ධ වූ බයිබලයේ **2 කොරින්ති 5/17-21 මෙකී ධර්මගුණය පැහැදිලිවම එළිදක්වා තිබේ. "යමෙක් ක්‍රිස්තුන් වහන්සේ තුළ සිටී නම්, එතැන ඇත්තේ නව මැවිල්ලකි. පැරණි දේ පහව ගොස් ඇත. දැන් සියල්ලම අලුත් වී තිබේ. සියල්ල පැමිණෙන්නේ දෙවියන් වහන්සේගෙන් ය. උන්වහන්සේ ක්‍රිස්තුන් වහන්සේ කරණ කොටගෙන අප තමන් වහන්සේට සමඟි කරගෙන, සමඟි කිරීමේ සේවය අපට දුන් සේක."**

ඒ සේවය ආගමික අධ්‍යාපනය හරහා මැනවින් දිස් වී තිබුනේ නම් ''මරියා හැරිස්'' නමැති ධර්මදූතවරිය පැවසූ අයුරින් භේදභින්න වීමේ අධ්‍යාපනයක් ඇති වීමට තිබූ ඉඩකඩ අහුරාලීමට හැකිකම තිබිණි. ගේබ්‍රියෙල් මොරාන් දහම් සේවියා පවසන පරිද්දෙන් අධ්‍යාපනයේ ධර්මතාව පොදු බවකට ගෙන ඒමේ ශක්ති සමාජ පද්ධතිය හරහා නිර්මාණය කර ගැනීමේ ඉඩකඩ ඇති පමණට තිබිණි.

සැබවින් මානව යථාර්ථය බෙදාහදා ගැනීම තුළ අපට මහත් පූර්ණත්වයක් කරා ළඟා කිරීම සඳහා මංපෙත් විවර කර ගත හැකිය. අධ්‍යාපනයේ ධර්මතාව මැනවින් දිස්වන්නේ නම් මෙය අවබෝධ කර ගැනීම එතරම් උගහට වන්නේ නැත. සර්ව සාමයික සහයෝගිතා සම්බන්ධතා නිර්මාණය කර ගත හැකි වන්නේ අධ්‍යාපනයේ ධර්මතාව තුළයි. එහෙත් ඊට පෙර ආගමික අධ්‍යාපනයක් අන්තවාදයෙන් හා මූලධර්මවාදයෙන් තොරව ඇතිකර ගත යුතුව තිබේ. **ආගමික අධ්‍යාපනය විශ්වාසය මුල්කර ගත් විධිමත් දැක්මක පිහිටා ඇතිවිය යුතු අතර ධර්මෝපදේශයේ එළිපත්ත පැන එය ඉදිරියටම ගමන් කරවිය යුතුව ඇත. ඥානෝපදේශයේ මූලකුරු සමඟ ආගමික අධ්‍යාපනය නතර කරලිය යුතු නැත. කතෝලික සමාජ දර්ශනය මෙයට සැබවින් පිටිවහලකි. ඉනික්බිතිව අධ්‍යාපනයේ ධර්මය තුළ දී එය ශක්තිමත් කර ඉදිරියට ගෙන යා යුතුයි.** එය වියවුල් කිරීමට දේශපාලනයේ කාලීන පටු බවට ඉඩ නොදිය යුතුයි. එහිදී සර්ව සාමාජික සහයෝගිතා සාකච්ඡාවේ තේමාව විය යුත්තේ, එක් එක් ආගමික ලෝකෝත්තර කාර්යය නොවේ. ඒවා අතගසා තිබෙන ලෞකික කාර්යයි. එනම් දේශපාලනයයි. ආගම සහ දේශපාලනය අතර සම්බන්ධතාවයි. ආගමික ප්‍රජාව අතර සහජීවනයේ දේශපාලනයක් සඳහා ඇති අවකාශය රැකගෙන පුළුල් කිරීමේ දේශපාලනය මතු කිරීමයි. කොටින්ම කිවහොත් ආගම් වල ලෞකික කාර්යභාරය අලුතින් පරිකල්පනය කිරීමයි.

කතෝලික දහම දේවධර්මවාදී අර්ථයෙන් බෙහෙවින්ම පූර්ණ නිසා අනික් ආගම්වලට වඩා ආගමික අධ්‍යාපනයත් අධ්‍යාපනයේ ධර්ම මේ වන විට පැහැදිලිව බුද්ධිගෝචර කොට තිබේ. දැන් තිබෙන්නේ ඊට ක්‍රියාකාරිව දායකවීම පමණකි.

**ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා**
**මීසම් සේවක,**
**සා. ජෝසප් දෙව්මැඳුර, පමුණුගම.**

# ළමා ප්‍රබෝධනය



## බිය

එදින මා නින්දට සැරසුණේ මදක් බියකිනි. මන්දයත්, ඒ දිනවල රටේ මුස්ලිම් ජනතාව හා සිංහල ජනතාව අතර යම් කලකෝලාහලයක් සිදුව තිබෙන අවධියක් වූ නිසාය. මාගේ දෙමව්පියන් ද නිදි වර්ජිතව සිටිනු මට යන්තමට මතකයේ රැඳී තිබුණි. සුව නින්ද, මට මහ බිය ගෙන දෙන්නක් විය. එසේ වුවත් මා සැතපීමට තීරණය කළේ, ඊළඟ මොහොතේ කුමක් සිදුවේ ද යන බියත් සමඟය. මධ්‍යම රාත්‍රිය උදා වීමට ප්‍රථම මා වරින් වර අවදි විය. එහෙත් ඒ අවස්ථා මාගේ මතකයේ රැඳී නැත.

එක්වරක මා නැවත අවදි වූ විට සිතා ගැනීමට නොහැකි දෙයක් සිදු වී තිබුණි. එය නම් මව ද පියා ද නිදන කාමරයෙන් අතුරුදහන් වී සිටීමයි. මට හීන් දාඩිය දැමුණි. ඒ දිනවල පාස්කු ප්‍රහාරය නම් කුරිරු ප්‍රහාරයෙන් මුළු ලක්දිවම බියෙන් වෙළී තිබීම එයට හේතුවයි. ඒ සිද්ධියෙන් පසු හැම දිනකම නැවත එවැනි ප්‍රහාරයන් සිදු වේද යන බියෙන් අප ගම්වැසියෝ ද අපි ද බියෙන් සිටියෙමු. මා සාලයට ගොස් බලන විට අසල්වැසි නැන්දා සහ ලොකු අම්මා ද මව ද පියා ද යමක් මුමුණමින් සිටියෝය. විදුලි පහන් කිසිවක් නොදල්වා මෙලෙස සිටීම මා හට මහා ප්‍රහේලිකාවක් විය. අඳුරේම ඔවුන්ගේ හඬ ඇසෙන දිශාවට ගොස් මම ඒ කතාවට සවන් දුනිමි. මා එය වැරැද්දක් ලෙස දුටුව ද මගේ සිත ද ගත ද පැවසුවේ එයට සවන් දෙන ලෙසය. පියා මෙසේ කියනු මට ඇසුණි. ''අන්න සෙට් එකක් වෑන් එකකින් ඇවිත් අපේ හන්දියට පැනලලු. උන් කඩු පොලු අරන් ඇවිත්ලු.'' ලොකු අම්මා එවිට ''අනේ දෙයියනේ මේක මාර වැඩක්නේ. අපේ රටේ අපිටම මෙහෙම බයෙන් මුලු ගැහෙන්න සිද්ධ වුණානේ''. මා හට සියල්ල පැහැදිලි වීමට මද වේලාවක් ගත විය. එවිට තාත්තා හට දුරකථන ඇමතුමක් ලැබුණි. ඒ ඔහුගේ මිතුරෙකි. මිතුරා ''ඒ මාර වැඩක්නේ අර සෙට් එක ඔන්න අපේ පාර පැත්තට එනවලු. මං ගමේ හැම එකාටම කිව්වා.... ඔය තියෙන මොකක් හරි



ආයුධයක් අතට ගන්න කියලා. උඹලත් මොකක් හරි ගනිල්ලා.''

මා හට යාන්තමට ඇසුණු ඒ වදන් වලින් මා බියෙන් ඇළලී ගියෙමි. පසුව මා කිසිවක් නැසෙන පරිදි මාගේ නිදන කාමරයට ගොස් දොර වසා ගතිමි. මා එසේ යන විට මල්ලීගේ කාමරයට මද වේලාවකට ගොස් ඔහුව දැනුවත් කිරීමට ගියෙමි. ඔහු කිසිවක් නැසුනාක් මෙන් ගැඹුරු නින්දකට වැටී සිටියේය. මා හට හැඬීමට තරම් බියක් ඇති විය. එහෙත් මා එය යටපත් කොට නොකඩවා දෙවියන් හට යාච්ඤා කළෙමි.

එවිටම ඈතින් එන වාහනයක ශබ්දය මා හට ඇසුණි. මාගේ බිය දෙගුණ තෙගුණ විය. මා හට කෑගැසීමට ද නොහැකිය. වාහනයේ ශබ්දය දැන් ළඟ ළඟම ඇසෙයි. මා දැන් සිටින්නේ මරණ බියෙනි. මා මාගේ පොරවනය ගෙන මුහුණ වසා ගතිමි. වාහනයේ ශබ්දය ළඟ ළඟමය. එය අවාසනාවකට අප නිවස ඉදිරිපිටම නතර කරවීය. එවිට පිරිසකගේ අඩි ශබ්දය මට ඇසුණි. එවිට අප නිවසේ ඉදිරිපස දොරටුවට තට්ටු කරන හඬ ද ඇසිණි. මම හිමින් සීරුවේ සාලයට ගියෙමි. මම දැන් දිවීමට සැරසී සිටියෙමි. අප පවුලේ අය ද සූදානමින් සිටින්නේ කවුරුන් පැමිණුණත් අවසානය දක්වා සටන් කරන සෙබළුන් ලෙසය.

දොර විවෘත විය. දොරින් ඉදිරියට පැමිණියේ පොලිස් නිලධාරීන්ය. මගේ ගිය පණ නැවත එකතු විය. මා හිතට එය සහනයක් ගෙන දුන්නේය. අප ග්‍රාමයේ හැම නිවසකටම පොලිස් ආරක්ෂාව යෙදුණි. එයින් පසු මා නොදැනුවත්වම නිදන කාමරයට ගිය කළ නින්දට වැටුණි. ඒ සිද්ධි මාලාවම මට චිත්‍රපට සේයාවක් සේ සිහිනෙන් පෙනෙනු ඇතැයි මම සිතුවෙමි. එහෙත් අදටත් එසේ නොවීය.

පසුදින උදෑසන මා කිසිවක් නොවුණා සේ මව ද පියා ද ඉදිරියේ කතාබහ කළෙමි. මල්ලී ද පසුව පැමිණ ''මට නම් ඊයේ හොඳට නින්ද ගියා වෙනදට වැඩිය''. මා හට එවිට පාලනය කරගත නොහැකි අන්දමේ කෝපයක් ඇති වුවද ඒ කෝපය පැමිණියේ ඇයි දැයි මට නොතේරිණි. රාත්‍රියේ කඩු මුගුරු රැගෙන පැමිණි වෑන් රියට කුමක් සිදු වූ ද යත් අදටත් අපි නොදනිමු. පෙරදින රැයේ සිදු වූ සියල්ල දකිමින් ඒ සියල්ල දරාගෙන මම සිටිමි. එවැනි පීඩනයකින් මා පසු වූ බව මගේ පවුලේ පිරිස අදටත් නොදනිති. මරණ බියේ අරුත සොයමින් සිටි මා හට මරණ බියේ සැබෑ අර්ථය මොහොතකට හෝ විඳීමට හැකිවීම මා ලද ආශ්චර්යයක් යැයි මම සිතමි.

**ඔකිත දෙව්මිණ රන්දෙනිය.**
**9 වසර C**
**ලොයොලා විදුහල, මීගමුව.**



# පුංචි විකුම්



ලසිත් අට වසරේ ඉගෙනුම ලබයි. ඉගෙනීමට මෙන්ම, ක්‍රීඩා කටයුතු කෙරෙහිද දස්කම් දක්වන ඔහු පාසලේ කැපී පෙනෙන ශිෂ්‍යයෙකි. පහේ ශිෂ්‍යත්වයට සමත් වීමට අවශ්‍යව තිබුණේ තව ලකුණු දෙකක් පමණි.

අම්මා නිතර නිතර අසනීප වන නිසා ගෙදර වැඩ කටයුතු බොහෝ දුරට සිදුවූයේ තාත්තා අතිනි. නංගිලා දෙන්නෙක් සිටින ලසිත්ද තාත්තාට හැමවිට උදවු කරයි. අම්මාගේ අසනීප නිසා නිතර ගෙදර රැඳී සිටින තාත්තා රැකියාවක් නොකරන අතර, උදේට ගමෙන් සොයා ගන්නා තැඹිලි ටිකක් විකුණා සුළු මුදලක් සොයා ගනී. සවස අවට ගොවිපළෙන් බිත්තර මිලදී ගෙන ගෙයින් ගෙට ගොස් විකුණයි. කොතෙකුත් ආර්ථික අපහසුතා සහ අම්මාගේ අසනීපය මැද වුවද, ඔවුහු සතුටින් ජීවත් වූහ.

බොහෝ දිනවල තාත්තාට ගෙදර වැඩකටයුතුවල යෙදෙන්නට සිදුවන නිසා, බිත්තර වෙළඳාම කළේ ලසිත්ය. අච්චවැස්ස ඔහුට ගානක් නැත. නිතර සිනා මුසු මුහුණින් සිටින ලසිත්ගෙන් බිත්තර ගන්නට ගමේ හැමදෙන බලා සිටිති. සුළු ලාභයක් තබාගෙන දිනකට බිත්තර තුන් හාරසියයක් විකුණන ලසිත් කියන්නේ, ඒ මුදල ගෙදර වියදමට යොදවනවා මෙන්ම, නංගිලා දෙන්නාගෙත් තමාගෙත් පාසල් කටයුතු සඳහා ප්‍රයෝජනයට ගනු ලබන බවයි. ඒ මේ කෙසේ වෙතත්, ලසිත් පාසල් වැඩ නම් අතපසු කළේ නැත.

ලසිත්ගේ යහපත් ගති පැවතුම් සහ ඉගෙනීමට දක්වන දක්ෂතා නිසා, මෙවර දහම් පාසල් ත්‍යාග ප්‍රදාන උත්සවයේදී ලසිත්ට විශේෂ ත්‍යාගයක් පිරිනැමීමට ගුරු මණ්ඩලය සාකච්ඡා කරමින් සිටින බව දැන ගන්නට ලැබුණි.

**ආදර දුවේ පුතේ, නැතිබැරිකම් කෙතෙකුත් තිබුණත් ඒ ගැන කිය කියා ළතවෙනවාට වඩා උත්සාහයක් හයියක් ඇති කර ගන්න. ලසිත් එයට කදිම ආදර්ශයකි.**


**- සූරිය මාමා -**

## ආදරණීය දරුවනි,

"ළමා ප්‍රබෝධනය" ට
ඔබගේ ලස්සන නිර්මාණ
'මාසික සිතුවිල්ල'
කවි / නිසඳැස් / ලිපි
ආදි වශයෙන් ලබා ගැනීමට,
අපි බොහොම කැමැත්තෙන් සිටිමු.
පන්තිභාර ගුරුතුමාගේ /
ගුරුතුමියගේ අත්සන ඇතිව
ඒ නිර්මාණ අප වෙත යොමු කරන්න.

**සංස්කාරක පියතුමා,**
**"භක්ති ප්‍රබෝධනය",**
**අංක 265, ඩීන්ස් පාර, මරදාන,**
**කොළඹ 10.**

# සභා ඉගැන්වීම් තුළින් දේවරාජ්‍යය පතළ කරන්නට වෙර දැරූ ශු. ජෝන් ඩාමසින් මුනිතුමා




ක්‍රි.ව. 675 දී දමස්කස් නගරයේ උපන් මෙතුමා පෙරදිග සභාවේ පිතෘවරයකු ලෙස සලකනු ලබයි. ඉතාම උසස් වංශවත් පෙළපතකට අයත් මෙතුමාගේ මුත්තණුවන් හෙරසිලියුස් අග රජුගේ බදු අයකරන්නන් අතර මූලිකත්වය ගත් ප්‍රබලයෙක් විය. මෙතුමා මුල් කාලයේ ජෙරුසලමේ ගත කළ අතර සිය අධ්‍යාපන කටයුතු එහිදී සඵල කිරීම මූලික අරමුණ විය. මෙසේ අධ්‍යාපන කටයුතුවලට අවධානය දෙමින් සිටිනා විට සිය පියා හදිසියේ මියයෑම නිසා ලෞකික දේ පිළිබඳ මහත් කලකිරීමට පත්ව තාපසයකු වීමට සියල්ල පසක තබා ඉටා ගත්තේය.

මෙතුමාගේ කාලයේ ඉස්ලාම් ප්‍රතිසංස්කරණය තුළින් සුළු ආසියාතික ප්‍රදේශවල ඉස්ලාම් ලබ්ධිය ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වූ අතර තුරුණු වියේ සිය සිතුම් පැතුම් සමිඳුන් කෙරේ පුද දී පැවිදි දිවියට එක්ව භාවනායෝගී තාපසයකු ලෙස වෙසෙන්නට වුයේය.

මෙතුමා සිරියානු සභාවේ ප්‍රබල සභා පිතෘවරයකු හා තාපසවරයකු ලෙස සලකනු ලබන අතර, දේව ධර්ම ශාස්ත්‍රයේ සභාවේ ද දේවධර්මයේ පඬිවරයකු ලෙස ද හැඳින්වේ. විශේෂයෙන් මරියෝත්තමාවන්ගේ ස්වර්ගාරෝපණය පිළිබඳ දේව ධාර්මික පදනම ඉදිරිපත් කරන සභා විශාරදයන්ට මෙතුමා ප්‍රබල දායකත්වයක් ලබා දී ඇත. මෙතුමා පිළිබඳ ඇතැම් තොරතුරු වලට අනුව මෙතුමා කිතු දහම වැළඳගන්නේ සිය තුරුණු වියේ දී බවත් සිය ඥාතීන් ඉස්ලාම් ලබ්ධිකයන් බවත් සිය පියාගේ වියෝවෙන් පසු මෙතුමා ද ඉස්ලාම් අධිකරණයක ක්‍රියා කළ ඇති බවත් පැවසේ.

මේ අනුව සභා විශාරදයන් පෙන්වා දෙන ආකාරයට ශු. කුරානය ශු. බයිබලය හා සභා ඉගැන්වීම් විග්‍රහ කිරීමට මේ නිසා මෙතුමාට විශේෂ නිපුණත්වයක් , හැකියාවක් තිබී ඇත. එසේම ග්‍රීක භාෂාව පිළිබඳ නිපුණතාවක් මෙතුමා කෙරේ වූ අතර පෙරදිග දර්ශන ශාස්ත්‍රයට ද මෙතුමා මහත් ලැදියාවක් දක්වා ඇත.

මේ නිසා සභාවේ මේ කාලය දී පැන නැගුණු ගැටලු ඉගැන්වීම් හා මතවාද දුරුකිරීමට ද මෙතුමාට හැකිවුණි. විශේෂයෙන් මරියෝත්තමාවන් දේවමාතාවන් යන දේව ධාර්මික ඉගැන්වීම් පතළ කිරීමට මෙතුමා ප්‍රබල දායකත්වයක් දැක්වූ අතර මරිය ගැති සභා පිතෘවරයකු ලෙස ද මෙතුමා සැලකේ. ක්‍රි.ව. 749 දී මෙතුමා ස්වර්ගස්ථ වූ අතර බයිසන්තීනු පිළිවෙත් තුළ පෙරදිග ඕර්තඩොක්ස් සභාවේ ප්‍රබල සුදුවරයකු ලෙසත් පෙරදිග හා බටහිර කතෝලික සභාවේ ද ගෞරවාදරයට පාත්‍ර වූ ශුද්ධවන්තයකු ලෙසත් මෙතුමාව පිළිගැනේ.

**ගරු ලක්මාලි ප්‍රනාන්දු,**
**පැවිදි සොහොයුරිය. ශු.ප.**
**ශු. පවුලේ පැවිදි ආරමය, කමරගොඩ.**

# ආධ්‍යාත්මිකත්වය සහ ස්ත්‍රීත්වය

ආධ්‍යාත්මිකත්වය සහ ස්ත්‍රීත්වය අතරේ පවත්නා සහසබඳතාව සම්බන්ධයෙන් ඇතැම්හු විවිධ නිදසුන් ගෙන හැර දක්වති. බොහෝවිට පන්සල්, පල්ලි කරා නිරන්තරව ම අඛණ්ඩව ම ඇදී යන්නේ ස්ත්‍රීන් ම යැයි පවසන ඔවුන් වැඩිදුරටත් පෙන්වා දෙන්නේ දානමාන පිංකම් සඳහා වැඩි වශයෙන් කර-උර දෙන්නේ ද ස්ත්‍රීන්ම වන බව ය.

එහෙත් ස්ත්‍රියගේ ආධ්‍යාත්මිකත්වය හුවා දැක්වීම සඳහා මේ නිදසුන පමණක් ප්‍රමාණවත් වන්නේ නැත. ඒ, ඇතැම්විට නොව බොහෝවිට ජීවිත භය හෝ පරලෝකය කෙරෙහි පවත්නා අවිනිශ්චිත හැඟීම හා බිය නිසා ද කිසියම් පුද්ගලයකු දැඩි ලෙස වන්දනාමානයට යොමුවිය හැකි නිසා ය. ආගමිකත්වය යනු වන්දනාමානය ම නොවේ. සැබෑ ආගමික පුද්ගලයා ආධ්‍යාත්මික වශයෙන් ද කිසියම් පිරිපුන් බවක්, පොහොසත්කමක් දරා සිටියි. අනික් අතට බෞද්ධ විහාරස්ථාන හෝ ක්‍රිස්තියානි පල්ලි කරා ඇදී යන දහස් සංඛ්‍යාත උවැසියන්, බැතිමතියන් සිටින මුත්, ඉස්ලාම් පල්ලියකට ඇතුළුවීමට වරම් ලබන්නේ පුරුෂ පක්ෂයට පමණකි. එය එසේ වූ පමණින් ඉස්ලාම් කාන්තාවගේ ආධ්‍යාත්මිකත්වය අවතක්සේරු කිරීම යුක්ති සහගත වන්නේ ද?

ක්‍රි.පූ. 2000 දී පමණ පැපිරස්වල පවා නිර්මාණය වී ඇතැයි සැලකෙන 'අරාබි නිසොල්ලාසය' නම් වූ සම්භාව්‍ය ග්‍රන්ථයේ, ඒ අපූරු කථා සංග්‍රහයේ එන කතාවස්තු සියල්ල එක් ස්ත්‍රියකගේ පරිකල්පනයි.

'අරාබි නිසොල්ලාසය හෙවත් එක්දහස් එක් රැය' ලෝකයේ භාෂා ගණනාවකට පරිවර්තනය වී ඇති, බටහිර විචාරකයන් විසින් පවා සම්භාව්‍ය කෘතියක් වශයෙන් පිළිගනු ලබන කථා සාගරයකි. පැරණි අරාබි ලෝකයේ ස්වර්ණමය යුගයේ සම්පාදිත පරිකල්පන පොදියක් වශයෙන් ද මෙය නම් කෙරෙයි.

කිසියම් වූ රජෙක්, සිය මෙහෙසියගේ අනාචාර හැසිරීම් දැකීමෙන් හටගත් පිළිකුල හා සිත්තැවුල හේතුවෙන් පොදුවේ මුළු මහත් ස්ත්‍රී සංහතියෙන් ම පළිගැනීමට සිතයි. මේ රජුව මුළුමනින්ම මෙල්ල කරන්නට, පරාජය කරන්නට හැකිවන්නේ එක් බුද්ධිමත් තරුණියකට ය. තරුණිය, රජු දණගස්වන්නේ ආයුධයකින් නොවේ. සිය සහජ බුද්ධිය භාවිතයට ගනිමින් ඇය මේ විස්කම කරන්නේ සම්‍යක්ප්‍රයෝගයකිනි.

එහෙත් දහසකුත් එකක් රාත්‍රියාමවල නිදි වරා, අපූරු පරිකල්පනයන් වචනයට නගමින් මේ කතාන්දර කී ස්ත්‍රියගේ නාමය පිළිබඳ පැහැදිලි සටහනක් හෝ ඇගැයීමක් හෝ දක්නට නැත. ඓතිහාසික වශයෙන් එවැනි දස්කම් විස්කම් දැක්වූ කාන්තාවන්ගේ නම් එකතුවක් ලේඛනගත කිරීමට හෝ එය මතුපරපුරට දායාද කිරීමට හෝ ඉතිහාසය කිසිවිටෙකත් සූදානම් නොවූ බවක් ඓතිහාසික මූලාශ්‍ර පරිස්සමින් පරිශීලනය කරන්නකුට ඉතා පැහැදිලිව පෙනී යයි. යුග පුරුෂයන්, මහා පුරුෂයන් ඉතිහාසයේ පිටු සරසා ඇති අවස්ථා විරල නොවුණ ද යුගස්ත්‍රියක ගැන මහාස්ත්‍රියක ගැන ඒ කොතැනකවත් සඳහන් නොවේ. ඉතා අඩුතරමින් ශබ්දකෝෂයකින් වුව අපට එවැනි පදයක් සොයා සපයා ගැනීම අසීරු ය. එය මෙසේ වූයේ ඇයි?

ශාරීරික වශයෙන් ශක්තිමත් යැයි පිළිගැනෙන ලෝකයේ වැඩි ප්‍රතිශතය පුරුෂයෝ ය. එහෙත් මානසික මට්ටමිනුත් එය එසේ යැයි තර්ක කළ හැකි නොවන්නේ මිනිස් බුද්ධියට ලිංගික හෝමෝනවල බලපෑමක් නොවන නිසා ය. ස්ත්‍රීත්වය හා ආධ්‍යාත්මිකත්වය පිළිබඳ කතාව ආරම්භ වන්නේ ද මෙතැනිනි.

**සමාජය කිසිවිටකත් ඔබට අවධානයෙන් (Awareness) පසුවන්නට** උගන්වා නැතැයි මෑතකාලීන ඉන්දියානු චින්තකයකු වන භගවත් ශ්‍රී රාජ්නිෂ් හෙවත් ඕෂෝ පවසයි. සංවේදිත්වය

වැඩෙන්නේ අවධානයත් සමඟ බව පෙන්වා දෙන ඕෂෝ, සිරුර අභ්‍යන්තරයෙහි සිසිල දනවන වායු සමීකරණය ලෙස නම් කරන්නේ 'මෛත්‍රිය' යි. ලෝකයට, සමාජයට ඉතා වැඩි වශයෙන් අවශ්‍ය වන දයාව, කරුණාව, ආදරය වැඩි වශයෙන් බෙදාදීමට හැකියාව පවතින්නේ ස්ත්‍රියට ද පුරුෂයාට ද යන ප්‍රශ්නය කෙරෙහි සාවධාන වෙමින් සෙන් කථා ඇසුරින් ස්ත්‍රියගේ සහජ ස්වභාවය පෙන්වා දෙන ඕෂෝ, වරක් එළිදක්වා ඇත්තේ මෙවැනි අදහසකි.

**සමාජයේ ඇතැම් මිනිස්සු අතිශයින් උණුසුම් වන අතර, ඔවුහු දයාවෙන් පිරුණ අය යැයි කල්පනා කරති. ඔවුනට සමාජය පරිවර්තනය කිරීමට ඇවැසි ය. සමාජ ව්‍යූහය වෙනස් කිරීමට ඇවැසි ය. ඔවුනට සියලු දෙයින් පරිපූර්ණ රාජ්‍යය (utopia) බිහි කිරීමට ඇවැසි ය. විප්ලවවාදීහු, සමාජවාදීහු, පරිපූර්ණ සිහින රාජ්‍ය මවන්නෝ අතිශයින් උණුසුම් චරිතයෝ වෙත්. ඔවුහු දයා ගුණයෙන් අනූන යැයි සිතති. එහෙත්, ඔවුනට ඇත්තේ කෝපයකි. ඔවුන්ගේ අරමුණ වෙනස් ය. ඔවුන්ගේ කෝපයට, අලුත් අරමුණක්, පෞද්ගලිකත්වයෙන් ඔබ්බට ගිය අරමුණක් ලැබී ඇත. සමාජය, සමාජ ව්‍යූහය, රාජ්‍යය හා කිසියම් සිදුවීමක් යනාදිය මේ අරමුණු බවට පත් ව ඇත. ලෙනින්, ස්ටාලින්, හා ට්‍රොට්ස්කි වැන්නෝ මේ වර්ගයට අයත් වෙති. ඔවුහු කිසියම් පුද්ගලයකුට එරෙහි නො වූ හ. ඔවුන්ගේ කෝපය එල්ල වූයේ සමාජ ව්‍යූහය නැත්නම් සැකැස්ම වෙත ය. ගාන්ධි ද බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයට එරෙහි වුණ, එවැනි ම උණුසුම් චරිතයකි. ඔහුගේ අරමුණ ද පෞද්ගලිකත්වයෙන් තොර එකක් විය. එබැවින් ඔහු ගේ කෝපය අපට නොහැඟේ. එහෙත් ඔහු පසු වන්නේ කෝපයෙනි. ඔහුට බාහිර ලෝකයේ යමක් වෙනස් කිරීමට ඇවැසි ය. ඔහුට එය ඉක්මනින් කරන්නට අවශ්‍ය වූ බැවින් ඔහු නොසන්සුන් ය. සටන් කිරීම අරඹයි. සටන් කිරීම සඳහා ක්‍රමෝපායක් ලෙස අවිහිංසා මාර්ගය තෝරා ගත්ත ද සටන් කිරීම සාහසික ය. ක්‍රමෝපායය කුමක් වුව ද සටන් කිරීම යනු ප්‍රචණ්ඩත්වය යි. විශේෂයෙන් ම ස්ත්‍රී පක්ෂය සටන් කිරීම සඳහා අවිහිංසා මාර්ගය තෝරා ගනියි. ගාන්ධි කෙළේ කිසිවක් නො වේ. ස්ත්‍රී පක්ෂයේ ප්‍රයෝගයක් තෝරා ගැනීම පමණි.**

*(OSHO - අමුතු තරණය - 84-85 පිටු*
*පරිවර්තනය: ෂර්ලි චන්ද්‍රා ප්‍රනාන්දු)*

මහත්මා ගාන්ධිතුමන් මෙන් බොහෝ අවිහිංසාවාදී, සාමකාමී පුද්ගලයන්, චින්තකයන් කාන්තාවන්ගේ සමාගමය අපේක්ෂා කළ බව, බොහෝ කාන්තාවන් ඔවුන් වටා රැඳී සිටි බව ඓතිහාසික තොරතුරු ඔස්සේ සනාථ වෙයි. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ද සිය අවසාන අවස්ථාවේදී (ශු. බයිබලයට අනුව) 'ජෙරුසෙලමේ දියණියනි, මා නිසා නොතැවෙන්න' යි කීවේ ඒ නිසා ය. රෝම සොල්දාදුවන්ගේ ප්‍රහාරයට ලක්වීම හේතුවෙන් උන්වහන්සේගේ මුවින් ගලාගිය රුධිරය පිසදැමීමට නිර්භයව ඉදිරිපත් වූවේ ද වෙරෝනිකා නම් වූ කාන්තාවයි.


ආධ්‍යාත්මිකත්වය සමඟ අත්වැල් බැඳගන්නේ දරාගැනීමේ ශක්‍යතාවයි. ස්ත්‍රියගේ දරාගැනීමේ හැකියාව උපරිම මට්ටමක පවතින බව බහුතරයකගේ පිළිගැනීමයි. ස්ත්‍රීන් බහුතරයකට නිහඬව බොහෝ දේ දරා ගැනීමට පුළුවන. බොහෝ ස්වාමිපුරුෂයන් කෝපය හමුවේ හැසිරෙන්නේ වියරු වැටුණවුන් මෙනි. හිතේ කේන්තියට පිඟන්, කෝප්ප, වීදුරු හා බිඳෙනසුලු භාණ්ඩ පොළොවේ දමාගැසීම බොහෝ විට ක්‍රීඩාවක් බවට පත්කරගෙන ඇත්තේ පුරුෂයන් ය. හිතේ අමාරුව සුවපත් කරගැනීමට මධුවිත ඖෂධයක් ලෙස භාවිත කරන්නන්ගේ අතිමහත් බහුතරය ද පුරුෂයෝම වෙති. බඩු පොළොවේ ගසා නිවෙස යකුන් නැටූ පිටියක් බවට පත්කොට පිටව ගොස් මංමාවත් දිගේ නන්නත්තාර ගමනක යෙදී

සිත සන්සිඳුණු පසු ආපසු නිවෙසට පැමිණීමේ පුරුද්ද ගැහැනුන්, විශේෂයෙන් ආසියාතික ගැහැනිය අත්හදා බලන්නක් නොවේ.

මේ සියල්ල අප අවධාරණය කර සිටින්නේ කාන්තා විමුක්තිය යන තේමා පාඨය ඉස්මත්තට ගෙන එය උත්කර්ෂයට නගා පුරුෂ විරෝධී ලොවක් නිර්මාණය කර ගැනීමේ අරමුණින් නම් නොවේ. අපගේ උත්සාහය වන්නේ මධ්‍යස්ථව, සාවධානව මෙහි සඳහන් කරණු ගැන සිතා බලන්නට අවකාශයක් විවර කරදීම පමණි,

**කැත්ලීන් ජයවර්ධන**

## ප්‍රහේලිකා අංක - 56



**හරහට**

1. ශුද්ධෝත්තම පියතුමන් වාසය කරනුයේ මෙහිය
3. පැවිදි නොවූ අය
4. ශු. බයිබලයේ සුවිශේෂකවරුන් ගණන
6. ඉසුරුමත් යන අර්ථය ගෙනදේ
7. කය එකතැන තිබුණත් මෙය එක්තැන් කර තබා ගැනීමට අසීරු කරුණකි.
8. ලොතරැයි ටිකට් පතක නමකි.
9. උක්ගස අපට වැදගත් වන්නේ මේවා නිෂ්පාදනය කිරීමටය.
11. ශරීරයට සමාන පදයකි.
13. මුස්ලිම්වරුන්ගේ ප්‍රධාන වන්දනා ස්ථානයකි.
14. ශු. පාවුලු තුමා මෙතුමාට ලියූ ලිපි දෙකකි.
15. විදේශීය යන අර්ථය ගෙනදේ

**පහළට**

1. මෙහි කබල් ගෑම සමහරුන්ගේ සිරිතය.
2. ............ විස නිසා මරණයට පවා පත්විය හැකිය.
3. බුලත් හෙප්පුවට අයත් වුවත් කපුවන්ගේ අතේ ද දැකිය හැකිය.
5. බෞද්ධ ජනතාවගේ පූජනීය වස්තුවකි.
7. පොළෝ මතුපිට ප්‍රදේශයක විවිධ භූමි ලක්ෂණ හා මං මාවත් දක්වන රූප සටහන
8. පසුගිය නොවැම්බර් මස ජනතාව විසින් අපේ රටේ පත් කරනු ලැබුවේ මොහුය.
9. කිසියම් වූ එල්ලයක් නැතිව විසිරීයාම මෙසේ හඳුන්වයි.
10. උපත සහ මරණය හැම කෙනකුටම .............. දෙයකි.
12. යකඩ බහුල වූ රසවත් ආහාරයකි.

**සැකසුම : ගරු. ලක්මාලි ප්‍රනාන්දු**
**පැවිදි සොහොයුරිය ශු.ප.**
**ශු.පවුලේ පැවිදි ආරාමය,**
**කමරගොඩ.**

ඔබගේ පිළිතුර තැපැල්පතක පමණක් ලියා පහත ලිපිනයට, 2020 ජනවාරි 31 ට පෙර තැපැල් කරන්න. ජයග්‍රාහකයින් අතුරින් තෝරා ගත් **තිදෙනකුට මුදලින් තෑගි පිළිවලින්**, රු.1000.00, රු. 750.00, රු. 500.00 බැගින් පිරිනැමේ.

**විශේෂ මතක් කිරීමක් -**

ප්‍රහේලිකාවේ විසඳුම් එවන විට ඔබේ නම, පන්තිය, පාසල හා පාසලේ ලිපිනය සඳහන් කර එවන්න.

ප්‍රහේලිකා අංක - 56
"ළමා ප්‍රබෝධනය".
අංක 265, ඩීන්ස් පාර, මරදාන, කොළඹ 10.

# කතෝලික ධර්මය
## අ.පො.ස ( සා/පෙළ ) විභාගය - 2020
## ආදර්ශ ප්‍රශ්න පත්‍රය

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

1) 1. දේව අනාවරණයේ මූලාශ්‍ර දෙක නම් කරන්න.
   2. ප්‍රඥා සාහිත්‍යයට අයත් ග්‍රන්ථ දෙකක් නම් කරන්න.
   3. මුල් කිතුනු සභාවේ ලක්ෂණ 2 ක් නම් කරන්න.
   4. ද්විතීය සම්මත ග්‍රන්ථ 2 ක් ලියන්න.
   5. ජුදා මූලාශ්‍රය සඳහා භාවිත වන තවත් නමක් ලියන්න.
   6. පංචපුස්තකය හඳුන්වන වෙනත් නම් දෙකක් ලියන්න.
   7. I.N.R.I. යන්නෙහි අර්ථය කුමක්ද?
   8. ස්නාවක ජුවාම් තුමාගේ දේශනයට යොමුවූ ප්‍රධාන ජන කණ්ඩායම් 2 ක් නම් කරන්න.
   9. කිතුනු විවාහයේ පරමාර්ථ දෙක ලියන්න.
   10. පූජකවරය දානය කිරීමට බලය ඇත්තේ කාටද?

2) 1. ශුද්ධවූ සතියේ ආරම්භ දිනය හා අවසාන දිනය ලියන්න.
   2. කතෝලික සභාව පිළිගන්නා සභා 3 ක් නම් කරන්න.
   3. දිව්‍ය පූජා යාගයට සහභාගී වීමේ වැදගත්කම කරුණු 5 ක් විස්තර කරන්න.

3) 1. දෙවියන් වහන්සේ ආබ්‍රහම් තුමා සමග ඇති කරගත් ගිවිසුමේ පොරොන්දු දෙක නම් කරන්න.
   2. මිනිසා අනික් මැවිලිවලට වඩා උසස් බව දක්වන කරුණු 3 ක් නම් කරන්න.
   3. කිතුනු සිසුවකු ලෙස තමාගේ අන්‍යාගමික යහළුවන් සමග කිතුනු විශ්වාසය ප්‍රකාශ කරන ආකාරය කරුණු 5 ක් විස්තර කරන්න.

4) 1. දිව්‍ය පූජා යාගය සිදු කිරීමේ ප්‍රධාන අරමුණු 2 ක් නම් කරන්න.
   2. දිව්‍ය සත්ප්‍රසාදීය ලක්ෂණ 3 ක් නම් කරන්න.
   3. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීමෙන් පසුව කිව හැකි යාච්ඤාවක් ලියන්න.

5) 1. අභිවෘද්ධි අලේපය ප්‍රසාද නිධානය ලබා ගැනිම තුළින් අපට ලැබෙන වරප්‍රසාද 2 ක් ලියන්න.
   2. අභිවෘද්ධි අලේපය ප්‍රසාද නිධානය එක් වරක් පමණක් ලැබීමට විශේෂ හේතුව කුමක්ද?
   3. අභිවෘද්ධි අලේපය ප්‍රසාද නිධානය ලැබීමෙන් පසු ඔබේ ජීවිතයේ ඇතිවිය යුතු වෙනස්කම් කරුණු 5 ක් විස්තර කරන්න.

## පිළිතුරු

1) 1. ශුද්ධ බයිබලය / ජීවන සහා සම්ප්‍රදාය
   2. ජෝබ් / ගීතාවලිය / ප්‍රේම ගී / ප්‍රඥාව
   3. ප්‍රේරිතයන්ගේ ඉගැන්වීම / සහභාගිකම / රොටි කැඩීම / යාච්ඤාව
   4. තොබිත් / ජුදිත් / බාරුක් / 1 මකබි / 2 මකබි
   5. මැසොරෙටික් පිටපත
   6. නීතිය / ව්‍යවස්ථාවලිය / මෝසෙස් තුමාගේ ව්‍යවස්ථාව
   7. ජේසු නසරේනු ජුදයන්ගේ රජ
   8. සාමාන්‍ය ජනතාව / අයකැමියන් / සෙබළුන්
   9. අන්‍යෝන්‍ය සහයෝගය හා ප්‍රේමය තුළ පූර්ණත්වයට පත්වීම / දරුවන් ජනනය හා ඇති දැඩි කිරිම.
   10. රදගරුතුමාට

2) 1. අළු බදාදා / පාස්කු ඉරිදා
   2. ලංකා සභාව / මෙතෝදිස්ත සභාව / බැප්ටිස්ට් සභාව / ග්‍රීක ඕතඩොක්ස් සභාව
   3. සිසු අදහස්

3) 1. විශාල ජාතියක් ඇති කරන බව / දේශයක් දෙන බව
   2. බුද්ධිය / නිදහස් කැමැත්ත / අමරණීය ආත්මය
   3. සිසු අදහස්

4) 1. දෙවියන් වහන්සේට නමස්කාර කිරිම / දෙ. ව. තුති පිදීම / පාපයට වන්දි ගෙවීම
   2. දේව ප්‍රසාද නිධානයක් / භෝජනයක් / යාගයක් / ගිවිසුමක් / ස්තුති කිරීමක්
   3. සිසු අදහස්

5) 1. 11 ශ්‍රේණිය 63 පිටුව
   2. නොමැකෙන ලාංඡනයක් තැන්පත් වීම
   3. සිසු අදහස්

---

**ඉදිරිපත් කිරීම :-**
**ජේ. ඒ. එල්. එම්. ශ්‍රීමතී සිල්වා මෙනවිය.**
**ආචාරිනී : මිනුවන්ගොඩ / ශ්‍රී ඥානෝදය ම.ම.වි. දිවුලපිටිය.**

# ලක්දිව ක්‍රිස්තු ශාසනය ( VI )

## අ.පො.ස. (උ.පෙ.) ක්‍රිස්තියානි ධර්මය / ශිෂ්ටාචාරය සඳහා අත්වැලකි.

## ඕලන්ද පාලන සමය

### ලන්දේසි යුගයේ දයා සේවාව හා අධ්‍යාපනය

පෘතුගීසි යුගයට වඩා ලන්දේසි යුගයේදී අධ්‍යාපනය විධිමත් ලෙස පවත්වාගෙන යන ලදි. ඒ සඳහා ඔවුන් භාවිත කළ උපක්‍රම කිහිපයකි.

1. ඔවුන්ගේ හැම දේවස්ථානයක් අසල පාසලක් ඉදිකළ අතර එහි ධර්මය ඉගැන්වීමට කතිකිස්වරයකු පත්කරන ලදි.
2. තම සභාවේ දේශීය දේවගැතිවරුන් පුහුණුව සඳහා සෙමනේරි ආරම්භ කිරීම.
3. දරුවකු වයස අවු 15 තෙක් අධ්‍යාපනය හැදෑරීම අනිවාර්ය කළ අතර අධ්‍යාපනය අවසානයේදී, ලාගිර්ඩන් සහතික පත්‍ර විභාගයට ඉදිරිපත් විය යුතුය.
4. ගුරු පුහුණුව සඳහා පහසුකම් සැපයීම විදේශ අධ්‍යාපනය ලැබීමට අවස්ථාවද හිමිවිය.
5. අධ්‍යාපන පරිපාලන කටයුතු වෙනුවෙන් ස්කෝලාල් කොමිසම, නමැති රාජ්‍ය දෙපාර්තමේන්තුවෙන් ආරම්භ කිරීම.
6. අනාථ දරුවන් සඳහා ළමා නිවාස පවත්වාගෙන යෑම.
7. ලාදුරු රෝගය මර්දනය සඳහා විශේෂ රෝහලක් ඉදිකිරීම.
8. වැඩිහිටි නිවාස, සමාජ ශුභසාධන සේවා වැනි කටයුතු පවත්වාගෙන යෑම දයා සේවා අතර ප්‍රධාන තැනක් ගනී.

### ලන්දේසින්ගෙන් ලක්දිව ලැබූ දායාද

ලන්දේසින් වසර 140 කට ආසන්න කාලයක් මෙරට මුහුදුබඩ ප්‍රදේශ පාලනය කර ඇත. ඔවුන්ගේ පාලන කාලයේදී ලක්දීවට දායාද කළ දීමනා බොහෝය.

1. මුද්‍රණ යන්ත්‍රය මෙරට හඳුන්වා දී ශුද්ධ ලියවිල්ලේ පිටපත් සිංහල බසින් මුද්‍රණය කර ජනතාව අතර නොමිලයේ බෙදා හැරීම.
2. කච්චේරි ක්‍රමය හඳුන්වා දී උපත් මරණ විවාහ ඉඩම් ලියාපදිංචි කිරීමේ ක්‍රම හඳුන්වා දීම.
3. රෝම ලන්දේසි නීති ක්‍රමය හඳුන්වා දි අධිකරණ ක්‍රියාවලිය පණගැන්වීම.
4. ග්‍රාමීය වෙළඳ කටයුතු සඳහා මං මාවත් සැදීම වරාය ආශ්‍රිත ප්‍රදේශ වැඩිදියුණු කිරීම යනාදිය පෙන්වා දිය හැකිය.

**ඔරතෝරි යානු නිකාය**

ශු. පිලිප්නේරි තුමන් විසින් 16 වන සියවසේදී පමණ ඔරතෝරියානු නිකාය ආරම්භ කරනුයේ රෝමයේදී ය. ඒ නිකාය පදවි පූජකවරුන්ට සාංඝිකව ජීවත් වීමට බිහිකරගන්නා ලද්දකි. ක්‍රි.ව. 1684 වසරේදී ඒ ව්‍යවස්ථා මාලාව යටතේ ගෝව නුවර ඔරතෝරියානු සංඝය පිහිටුවා ගන්නා ලද්දේ පස්කුවෙල් ද කොස්තා ජෙරමියස් පියතුමා විසිනි. පෘතුගීසි සමයේ සිටි විදේශීය මිෂනාරිවරුන් පිටුවහල් කළ පසු කිසිදු පූජක වරයෙක් ඉතිරි නොවිය. එම අඩුව පිරවීමට ඉන්දියාවේ ගෝව නුවර සිටි ඔරතෝරියානු පියවරු රහසිගතව ලක්බිමට පැමිණියහ. ඔවුන් අතර ප්‍රථමයා වූයේ 1687 ලක්දිවට පැමිණි ගරු ජුසේ වාස් පියතුමාය. ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමා ද ඒ නිකායට අයත්වේ.

**ජුසේ වාස් පියතුමාගේ ජීව දත්ත**


| | | |
|---|---|---|
| **ජෝසප් වාස් පවුලේ තෙවැනි දරුවාය** | | |
| **උපත** | - | 1651 අප්‍රියෙල් 21 |
| **උපන් ස්ථානය** | - | ගෝව නගරයට නුදුරු සැන්කෝලේ ප්‍රදේශය |
| **පූජක වරය** | - | 1676 ගෝවේ ශාන්ත කතරිනා ආසන දෙව්මැදුරේ දී |
| **ලක්දිවට පැමිණීමට පෙර සේවාව** | - | 1676-1681 ගෝව ප්‍රදේශය, 1681-1684 කැනරාව |
| **ඔරතෝරියානු නිකායට එක්වීම** | - | 1685 සැප්තැම්බර් 25 |
| **ලක්දිවට පැමිණීම** | - | 1687 මැයි මස |
| **මරණයට පත්වීම** | - | 1711 ජනවාරි 16 |
| **වන්දනීය නාමය** | - | 1989 මැයි 13 වන දින දෙවන ජුවාම් පාවුලු සුදුතුම් පියාණන් අතින් |
| **භාග්‍යවරය** | - | 1995 ජනවාරි 21 |
| **ශුද්ධවරය** | - | 2015 ජනවාරි 14 පළමු වන ප්‍රැන්සිස් සුදුතුම් පියාණන් |

ජුසේවාස් පියතුමාගේ ලක්දිව දූත මෙහෙවර ලන්දේසී යුගයේ ලක්දිව එකම කතෝලික පූජක තුමකු නොමැති යුගයකි. ඒ සමයේ ලක්දිව කිතු සසුන මිලාන වීමට ඉඩ නොතබා ආරක්ෂා කර ගන්නා ලද්දේ වාස් පියතුමන් විසිනි. එතුමා අතින් සිදු වූ දූත සේවාව සුවිශාලය.

ක්‍රි.ව. 1687-1689 යාපනය සිල්ලාලෙයි ග්‍රාමය කේන්ද්‍ර කර ගනිමින් ලක්දිව එතුමන්ගේ දූත සේවාව ආරම්භ කරන ලදී. එතුමන්ගේ පළමු පා සලකුණ සටහන් වූයේ මන්නාරම් වෙරළේය. ලක්දිවට ගොඩබැසීමෙන් පසු එතුමා දැඩි විඩාව හේතුවෙන් රෝගාතුරව කෙටි කාලයක් සිට ඇත. පසුව ඉතා රහසිගතව කතෝලිකයන් සොයා යමින් දිව්‍ය පූජාව පවත්වමින් ආගම දහම උගන්වමින් අති විශාල දූත සේවාවක් ඒ ප්‍රදේශයේ කර ඇත. ක්‍රි.ව. 1690-1692 පුත්තලමේ දූත සේවාවේ යෙදුණි. ක්‍රි.ව. 1692-1697 කන්ද උඩරට සිරකරුවකු ලෙස සිටියේය. ඉන් නිදහස ලැබූ පසුව ඒ ප්‍රදේශයේ ධර්මදූත කටයුතු වල යෙදීමත් සේවා අතර වේ. ක්‍රි. ව. 1698 සිට ලක්දිව සියලු ප්‍රදේශ ආවරණය වන පරිදි ධර්ම දූත චාරිකාවල එතුමා නිරත වී ඇත. ලක් දෙරණට ජුසේවාස් පියතුමාගෙන් ලැබූ එඬේර සේවාව නොවන්නට දේශීය කිතු සසුනක් සොයා ගැනීමට නොහැකිය.

**සටහන - එස්. හේමාල් පෙරේරා**


# 16 වසරක විශිෂ්ඨත්වය ස්කයි ලයින් ට්‍රැවල්ස් වෙතින් චාරිකා රැසක් දැන් ඔබ සදහාමයි



## ශුද්ධවූ දේශය

**දින 09**

පිටත්වීම 2020
පෙබරවාරි මස 15
මාර්තු මස 05 සහ 17
අප්‍රේල් මස 02 සහ 14



## මැජුගෝරිය

**දින 07**

මිලාන් - පාදුවා
රෝසකුසුම - වැනීසිය

පිටත්වීම 2020
අප්‍රේල් මස 14




## වේලන්කන්නි

**දින 05**

- වේලන්කන්නි සිද්ධස්ථානය
- ශාන්ත තෝමස් බැසිලිකාව
- කිරි පල්ලිය
ඇතුළු තවත් ස්ථාන රැසක් කරා

පිටත්වීම සෑම මසකම




## ගෝවා / වේලන්කන්නි

**දින 07**

- ශු ෆ්‍රැන්සිස් සේවියර් තුමාගේ දේහය
- ශාන්ත තෝමස් බැසිලිකාව
ශු ජුසේවාස් පියතුමන්ගේ ජීවිතය සම්බන්ධ
ස්ථාන ඇතුළු තවත් ස්ථාන රැසක් කරා

පිටත්වීම සෑම මසකම




## ලූර්දු / පාතිමා

**දින 10**

ප්‍රංශය
පෘතුගාලය
ස්පාඤ්ඤය

පිටත්වීම 2020 අප්‍රේල් - මැයි - ජුනි - අගෝස්තු යන මාසයන්හීදී



## ලූර්දු / පාතිමා සහ පාදුවා

**දින 16**

ප්‍රංශය පෘතුගාලය
ස්පාඤ්ඤය
ඉතාලිය

පිටත්වීම 2020 මැයි සහ අගෝස්තු යන මාසයන්හීදී

අමතන්න 077 38 75 081
077 38 75 083 / 077 38 75 078
077 38 75 082

IATA Accredited Agent

Skyline Travels

**ස්කයි ලයින් ට්‍රැවල්ස් (පුද්) සමාගම**
37, කතෝලික මධ්‍යස්ථානය, ශාන්ත ආනා වීදිය, කුරුණෑගල.
ශාඛාව : 169 A " සමනල ගොඩනැගිල්ල ", ග්‍රීන්ස් පාර, මීගමුව.
0377 390 590 -3 / 0317 390 390 -3
www.skylinetravels.lk / info@skylinetravels.lk